# संस्कृतभाषा

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූලික පිරිවෙණ

3
ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Scanned by CamScanner

# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

# 3 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කෘත භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

3 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0505-8

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

## පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි .එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පන්ති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාබුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** :
ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** :
ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්‍ෂණය** :
ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** :
පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** :
පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය** :

මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය** :

පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය හසලක සෝමරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
කො/ විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය

පූජ්‍ය මාර්තුපිටියේ මෙත්තාරාම හිමි
ගුරු උපදේශක, කළු/ ශ්‍රී ධම්මරතන මූලික පිරිවෙණ,
හොරණ

පූජ්‍ය මීගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති, ගම්/ ශ්‍රී ධීරානන්ද විද්‍යායතන
පිරිවෙණ, තැඹිලිගස්මුල්ල, මාකොළ

එච්. එම්. ජයන්ත හේරත්
පරිවේණාචාර්ය, මාර/ශ්‍රී රතනපාල මහ පිරිවෙණ
කොටුව, මිගදාය, මාතර

**භාෂා හා විෂය කරුණු සංස්කරණය** :

මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| **සෝදුපත් කියැවීම** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | පූජ්‍ය රූපහ ඤාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ගම්/ ශාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම |
| | | පූජ්‍ය අබේසේකරගම විජිත හිමි<br>පරිවේණාධිපති, ගා/ ශ්‍රී රේවත මහ පිරිවෙණ<br>කුඹල්වැල්ල, ගාල්ල |
| | | පූජ්‍ය නෙල්ලිවල සිරිනන්ද හිමි<br>පරිවේණාචාර්ය<br>ගම් / ශ්‍රී සුදර්ශන ධර්මායතන මූලික පිරිවෙණ<br>තිඹිරිගම, කිරිදිවැල |
| | | ඩබ්. ලසන්ත කුමාර<br>පරිවේණාචාර්ය, ගම්/පද්මාවතී මහ පිරිවෙණ<br>කැරගල, හේනේගම |
| **පිටකවර නිර්මාණය** | : | ජේ. එම්. තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විවිධ සහාය** | : | පී. ජී. බී. බුද්ධිකා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙනගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගනිමිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන

පිටු අංකය


ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය iii

අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය iv

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය v

පෙරවදන vi

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vii

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය viii

විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය ix

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් xii

ජාතික අරමුණු xvi

මූලික නිපුණතා xvii

විෂය අධ්‍යයනයේ අරමුණු xx

විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම xxi

විෂය නිර්දේශය xxiii

පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය xxxv

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව 3

පාඩම 2 - දේවනාගරී අක්ෂරමාලාව 7

පාඩම 3 - නාමපද 13

පාඩම 4 - ආඛ්‍යාතපද 17

පාඩම 5 - සන්ධි 23

පාඩම 6- සමාස 32

පාඩම 7 - තද්ධිත 38

පාඩම 8 - කෘදන්ත 41

පාඩම 9 - වාක්‍ය නිර්මාණය 47

පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත නාම වරනැගිල්ල 52

පාඩම 11 - නිර්දිෂ්ටග්‍රන්ථ - ව්‍යාසකාරය 56

පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - ප්‍රථමාදර්ශය 58

පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 3 60

පාඩම 14 - හිතෝපදේශය 63

ඇගයීම හා තක්සේරුකරණය 65

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවයශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

## සංස්කෘත භාෂාව
## විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 03 | **I** | 1.1, 1.2, 2.1, 3.1, 3.2 9.1, 9.2, 9.3, 10.1, 10.2 | 60 |
| | **II** | 3.2, 4.1, 5.1, 6.1, 7.1, 8.1, 9.1, 10.1, 10.2 | 60 |
| | **III** | 5.1, 6.1, 7.1, 8.1, 9.1, 9.2, 9.3, 10.1, 10.2 | 55 |
| | | එකතුව | 175 |

# संस्कृतपाठ्यक्रमः

**සංස්කෘත විෂය නිර්දේශය**

## 3 ශ්‍රේණිය

**आचितोऽति च शास्त्रार्थं - आचारे स्थापयत्यपि ।**
**स्वयमप्याचरेद्यस्तु - स आचार्य इतिस्मृतः ॥**

යමෙක් විද්‍යාශාස්ත්‍ර අර්ථයෙන් දැනුම රැස් කරන්නේ ද, අන්‍යයන් ආචාර ධර්මයෙහි පිහිටුවන්නේ ද, එසේ ම තමනුත් එම ආචාරයෙහි හැසිරෙන්නේ ද, ඔහු 'ආචාර්ය' නම් වෙයි.

# වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| නිපුණතාව \ ශ්‍රේණිය | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධිපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාසපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්තපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.** | 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද භාවිත කරයි. | 1.1.1 ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද<br>• ප්‍රභේද අටකින් යුත් ස්වරාක්ෂර<br>• හ්‍රස්ව<br>• දීර්ඝ<br>• ප්ලුත<br>• සමානාක්ෂර<br>• සන්ධ්‍යක්ෂර<br>• සවර්ණ<br>• නාමින්<br>• අනාමින් | 1.1.1<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අට නිදසුන් සහිත ව පහදයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර එහි ප්‍රභේද අටට වෙන්කර ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි. | 15 |
| | | 1.1.2 ප්‍රභේද දහ දොළහකින් යුත් ව්‍යඤ්ජනාක්ෂර<br>• වර්ගාක්ෂර<br>• අඝෝෂ<br>• ඝෝෂ<br>• අල්ප ප්‍රාණ<br>• මහාප්‍රාණ<br>• වර්ගමූල<br>• වර්ගාන්ත<br>• අනුනාසික්‍ය<br>• අන්තඃස්ථ<br>• ඌෂ්මන්<br>• අනුස්වාර<br>• විසර්ග | 1.1.2<br>දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර එහි ප්‍රභේද දොළහට වෙන්කොට ලියයි.<br>• දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.2 දේවනාගරී අක්ෂරමාලාවේ උත්පත්තිස්ථාන පෙන්වා දෙයි. | 1.2<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .......... යනාදි පාඨය | 1.2<br>• අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨ කටපාඩමින් ප්‍රකාශ කරයි; ලියයි.<br>• සංස්කෘත භාෂාවෙන් දැක්වෙන අක්ෂර උප්පත්ති ස්ථාන සිංහලෙන් හඳුන්වා දෙයි.<br>• අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨවලට අයත් අකුරු සියල්ල ලියා පෙන්වයි. | |
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 සර්ව නාම නිවැරදි ව භාවිත කරයි. | 2.1.1 සර්වනාම<br>• සර්වනාම සරල ව හැඳින්වීම<br>• සර්වනාම යෙදෙන අවස්ථා<br>• සර්වනාම, විශේෂණ නාම ලෙස යෙදෙන අයුරු<br>• නාමපද වෙනුවට සර්වනාම යෝජනය | 2.1.1<br>• සර්වනාම යනු මොනවාදැයි නිදසුන් සහිත ව පහදයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම ප්‍රකාශ කරයි.<br>• මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී සර්වනාම යෙදෙන ආකාරය නිදසුන් සහිත ව ප්‍රකාශ කරයි.<br>• විශේෂණපද වශයෙන් සර්වනාම යෙදෙන අවස්ථා ගෙනහැර දක්වයි.<br>• නාමපද වෙනුවට සර්වනාම යෝජනය කරමින් වාක්‍යනිර්මාණය කරයි. | 15 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 2.1.2 පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග සර්ව නාම<br>• සර්වනාම ශබ්ද වරනැගීම<br>• අස්මද් ශබ්දය<br>• යුෂ්මද් ශබ්දය<br>• තද් ශබ්දය | 2.1.2<br>• වාක්‍යවල ඇති ලිඞ්ගත්‍රයට අයත් නාමපද වෙනුවට සුදුසු සර්ව නාමපද යොදයි.<br>• අදාළ ශබ්ද සැලකිල්ලට ගනිමින් දෙනු ලබන සර්ව නාම පද පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් වර්ග කරයි.<br>• අදාළ ශබ්ද සැලැකිල්ලට ගනිමින් දෙනු ලබන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග සර්වනාම පද වරනගයි. | |
| **3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.** | 3.1 ආඛ්‍යාතවල ධාතු මූලය වෙන් කරයි. | 3.1 ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය | 3.1<br>• දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය ඉස්මතු කර පෙන්වයි. | 15 |
| | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි වරනගමින් නිවැරදි ව භාවිත කරයි. | 3.2 ලට්, ලඞ් හා ලෝට් යන ලකාර, උභයපදයෙහි වරනැගීම<br>• පරස්මෛපද ප්‍රත්‍ය<br>• ආත්මනෙපද ප්‍රත්‍ය | 3.2<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද යෝජනා කරයි.<br>• ලට්, ලඞ් හා ලෝට් යන ලකාර තුනෙහි උභයපදයට අදාළ ව ධාතු වරනගයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.** | 4.1 ස්වරසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.1 ස්වරසන්ධිය<br>• ස්වරසන්ධි ප්‍රභේද<br>  • දීර්ඝසන්ධිය<br>  • ගුණසන්ධිය<br>  • වෘද්ධිසන්ධිය<br>  • ව්‍යස්තසන්ධිය<br>  • ලෝපසන්ධිය<br>  • ලෝපශ්සන්ධිය<br>  • ආදේශසන්ධිය<br>  • ආගමසන්ධිය<br>• නිර්දිෂ්ට පාඨ ඇසුරින් දෙනු ලබන ස්වරසන්ධි පද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.1<br>• ස්වරසන්ධිය සහිත වචන නම් කරයි.<br>• ස්වරසන්ධි ප්‍රභේද නම් කරයි.<br>• ස්වරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කර පෙන්වයි.<br>• ස්වරසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• ස්වරසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පාඨවලින් ස්වරසන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• ස්වරසන්ධි පද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතු කර පෙන්වයි. | 10 |
| **5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.** | 5.1 සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 5.1.1 සමාස නාමික ව හඳුන්වා දීම | 5.1.1<br>• වෙන් වෙන් ව පවත්නා නාමපද දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට එක් නාමපදයක් වන ලෙස ගැළපීමෙන් සමාස නිර්මාණය වන බව ප්‍රකාශ කරයි.<br>• පහත දැක්වෙන සමාස නිදසුන් වශයෙන් දක්වයි.<br>වාචං වාචම් ප්‍රති = ප්‍රතිවාචම්<br>චීවරාය වස්ත්‍රම් = චීවරවස්ත්‍රම්<br>(සරල හා නිතර භාවිත වන නිදසුන් පමණක් දැක්වීම සෑහේ.) | 10 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 5.1.2 සමාස වර්ග<br>• අව්‍යයීභාවසමාසය<br>• තත්පුරුෂසමාසය<br>• ද්වන්ද්වසමාසය<br>• බහුව්‍රීහිසමාසය<br>• කර්මධාරයසමාසය<br>• ද්විගුසමාසය<br>(ඒ ඒ සමාසවල වෙනස හඳුනා ගැනීමසඳහා පමණක් උදාහරණ භාවිත කිරීම සෑහේ.) | 5.1.2<br>• සංස්කෘත භාෂාවේ සමාසවර්ග හයක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• සමාසවර්ගහය නම් කරයි. | |
| | | 5.1.3 සමාසවල ප්‍රයෝජන<br>**ඓකපද්‍යං, ඓකස්වර්‍යං 'ඒකවිභක්තිකත්වං ච සමාසස්‍ය ප්‍රයෝජනම්.'**<br>• පද වැඩි ගණනක් එක් පදයකින් දැක්විය හැකි වීම<br>• එක්පදයක් ලෙස උච්චාරණය කළ හැකි වීම<br>• එකවිභක්තියකින් අවසන් වීම | 5.1.3<br>• සමාසවලින් භාෂාවකට ඇති ප්‍රයෝජන විස්තර කරයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.** | 6.1 තද්ධිත වර්ගවලට නිදසුන් දක්වයි. | 6.1 තද්ධිත වර්ග<br>• අපත්‍යතද්ධිත - නිදඃ ගෞතම<br>• භාවතද්ධිත - නිදඃ මෘදුතා<br>• අස්ත්‍යර්ථතද්ධිත - නිදඃ ප්‍රාඥ<br>• සමූහාර්ථතද්ධිත - නිදඃ බන්ධුතා<br>• අතිශයාර්ථතද්ධිත - නිදඃ ලඝුතර<br>• අනේකාර්ථතද්ධිත - නිදඃ මාගධික<br>• සඞ්0ඛ්‍යාතද්ධිත - නිදඃ දශම<br>• අව්‍යයතද්ධිත - නිදඃ උත්තර<br>(හඳුනාගැනීම සඳහා පමණක් නිදසුන් දැක්වීම ප්‍රමාණවත් ය.) | 6.1<br>• තද්ධිතවර්ග අට නම් කරයි.<br>• නිදසුන් වශයෙන් දී ඇති තද්ධිත වාක්‍යවල යොදයි. | 10 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.** | 7.1 කෘදන්ත පිළිබඳ දැනුවත් බව ප්‍රදර්ශනය කරයි. | 7.1 කෘදන්ත නාමික ව හඳුන්වා දීම<br>• ත්‍රෛකාලිකකෘදන්ත<br>• අතීතකෘදන්ත<br>• වර්තමානකෘදන්ත<br>• අනාගතකෘදන්ත<br>• අව්‍යයකෘදන්ත<br>- තුමන්තක්‍රියා<br>- පූර්වක්‍රියා<br>• භාවකෘදන්ත<br>• ස්ත්‍රීකෘදන්ත<br>(හඳුනාගැනීම සඳහා පමණක් නිදසුන් දැක්වීම සෑහේ.) | 7.1<br>• සංස්කෘත භාෂාවේ ඇති කෘදන්ත 11 අතුරින් ත්‍රෛකාලික, අතීත, වර්තමාන, අනාගත, අව්‍යය, භාව සහ ස්ත්‍රී යන කෘදන්ත හත වාචෝද්ගත ව නම් කරයි.<br>• දෙනු ලබන කෘදන්තවර්ග හත සටහනකින් ඉදිරිපත් කරයි.<br>• අව්‍යයකෘදන්තවල ප්‍රභේද දෙකක් ලෙස තුමන්තක්‍රියා සහ පූර්වක්‍රියා නම් කරයි.<br>• ඉහත සියලු ම කෘදන්ත නියමිත ප්‍රත්‍ය යෙදීමෙන් සෑදෙන ආකාරය පෙන්වයි. | 10 |
| **8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 8.1 උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි. | 8.1 උක්තය, ආඛ්‍යාතය හා කර්මය ඇති සරල වාක්‍ය<br>• **ලට්, ලඞ්, ලෝට්** ලකාරවලට අදාළ වාක්‍ය<br>• වචනත්‍රයට අදාළ වාක්‍ය<br>• පුරුෂත්‍රයට අදාළ වාක්‍ය | 8.1<br>• උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති **ලට්, ලඞ්, ලෝට්** ලකාරවලට අදාළ සරල වාක්‍ය ලියයි.<br>• එක් ලකාරයකට අයත් සරල වාක්‍යයක් දුන් විට අනෙකුත් ලකාරවලට හරවයි.<br>• වචනත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.<br>• ඒකවචනයට අයත් සරල වාක්‍යයක් දුන් විට ද්විවචනයට සහ බහුවචනයට හරවයි.<br>• පුරුෂත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි. | 15 |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **9.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වය ලබයි.** | 9.1 සංස්කෘත වරනැගිල්ල පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.1 **සංස්කෘත නාම වරනැගිල්ල** | 9.1<br>• සංස්කෘත නාම වරනැගිල්ල වනපොත් කරයි.<br>• අන්තය අනුව වෙනස්කම් හඳුනාගෙන වරනගයි.<br>• වරනගන ලද විභක්ති  අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි. | 35 |
| | 9.2 ව්‍යාසකාරය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.2 **ව්‍යාසකාරය** (31 සිට අවසානය දක්වා) | 9.2<br>• ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.<br>• ව්‍යාසකරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරයෙන් ලියයි.<br>• විවිධ අවස්ථාවල දී උපදෙස් දීම සඳහා ව්‍යාසකාරය යොදා ගත හැකිබව ප්‍රකාශ කරයි. | |
| | 9.3 ප්‍රථමාදර්ශය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වයක් ලබයි. | 9.3 **ප්‍රථමාදර්ශය** (1 සිට 15 පාඩම්) කියවීම හා පරිවර්තනය කිරීම | 9.3<br>• ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය කියවයි.<br>• ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කරයි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි.** | 10.1 සංස්කෘත පාඨමාලා 03 ග්‍රන්ථය ඇසුරින් ප්‍රත්‍යශතකය රසවිඳියි. | 10.1 ප්‍රත්‍යශතකය<br>• ප්‍රත්‍යශතකයේ ( 3,7, 12, 14, 18, 22, 27, 30, 31, 33, 34, 40, 41, 43, 50, 54, 57, 58, 60, 62, 66, 69, 71, 79, 100 යන අංකවලින් දැක්වෙන ශ්ලෝක) | 10.1<br>• ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• ප්‍රත්‍යශතකය රසවිඳියි. | 40 |
| | 10.2 සංස්කෘත පාඨමාලා 03 ග්‍රන්ථය ඇසුරින් හිතෝපදේශය රසවිඳියි. | 10.2 හිතෝපදේශය<br>• හිතෝපදේශයේ ප්‍රස්තාවිකා කොටසෙහි එන ( 2, 3, 4, 6, 7, 10, 11, 12, 13, 16, 17, 18, 20, 22, 23, 24, 25, 26, 27,30, 31, 32, 33, 34, 36, 37, 38, 39, 40, 41, 42, 43, 44, 47, 48 අංක දරන ශ්ලෝක)<br>• හිතෝපදේශයේ එන කථා<br>- ආගන්තුකයකු සමග මිත්‍ර වූ මුව-කපුටු-සිවල් ආදීන් පිළිබඳ කථාව | 10.2<br>• හිතෝපදේශයේ අදාළ ගද්‍ය සහ පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• හිතෝපදේශයේ එන ගද්‍ය සහ පද්‍ය කොටස් මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• හිතෝපදේශය රසවිඳියි. | |

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | (ආගන්තුකේන සෞහාර්දෙ මෘගකාකජම්බූකකථා)<br>- නුපුරුදු කෙනකුට නවාතැන් දුන් අන්ධ ගිජුලිහිණියා බළලා හා පක්ෂීන් පිළිබඳ කථාව<br>(අපරිචිතාය වසතිදානේන්ධගෘධ්‍ර මාර්ජාරපක්ෂීකථා)<br>- අතිශයින් ලොල් වූ වැදි-මුව-ඌරු-සර්ප-සිවල් ආදීන් පිළිබඳ කථාව<br>(අතිලෝභේ ව්‍යාධ-මෘග-ශූකර- සර්ප-ජම්බූකකථා) | | |

## නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (3 ශ්‍රේණිය)

### 1. නිර්දිෂ්ටග්‍රන්ථ

- සංස්කෘත භාෂාව - 03, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ව්‍යාසකාරය (31 සිට අවසානය දක්වා)
- සංස්කෘත ප්‍රථමාදර්ශය 01 - 15 පාඩම්, විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව - 2010
- සංස්කෘත පාඨමාලා - 03, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, පෑලියගොඩ - 2016
- සාරස්වත ව්‍යාකරණම් (දේවනාගරී) ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, උදය ග්‍රැපික්ස්, රත්තණපිටිය - 2016

### 2. පරිශීලනීය ග්‍රන්ථ

- සංස්කෘත අකුරු ලියමු - (01) ප්‍රාචී අධ්‍යාපන ප්‍රකාශන, (සංයුක්ත තැටිය සහිත ව)
- භාෂණසංස්කෘතම් - පූජ්‍ය උඩවෙල රේවත හිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2010
- කිං සංස්කෘත භාෂයා රචනාං ලිඛාමඃ - පූජ්‍ය උඩවෙල රේවත හිමි, ආචාර්ය කේ. බී. ජයවර්ධන, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2012
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, 2016

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික හා වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

**තක්සේරු හා ඇගැයීම් කාර්යය**

**පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ** පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගැනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගැනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල් ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල් ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. '**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා**' ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන් ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නො වුව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත්, එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත්, භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කළ යුතු ය. එ විට පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කෙරේ.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmisson Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) ගුරුවරයා අනුගමනය කරනු ඇතැ යි මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකු ගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඉගැනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන් ගේ ඉගැනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයා ගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂයය සමස්ත පිරිවෙන් පද්ධතියේ ප්‍රධාන සහ අනිවාර්ය භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගැනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව - i

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද භාවිත කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටක් ඇති බව ප්‍රකාශ කරයි.
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අට නිදසුන් සහිත ව පහදයි.
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර එහි ප්‍රභේද අටට වෙන්කර ලියයි.
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහක් ඇති බව ප්‍රකාශ කරයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර එහි ප්‍රභේද දොළහට වෙන්කොට ලියයි.
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහට අයත් අකුරු සහිත වචන කියවයි; ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 සිසුන්ට ලබා දී අක්ෂරමාලාව සිසුන් සමග හඬනගා කියවන්න.
- අක්ෂරමාලාවේ ස්වර සහ ව්‍යඤ්ජනප්‍රභේද පිළිබඳ සිසු අවධානය යොමු කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 1 යොදා ගනිමින් ස්වර 14 සිසුන් සමග කියවන්න.
- ස්වරප්‍රභේද අට සිසුන්ගෙන් විමසන්න.
- ස්වරප්‍රභේද අට සිසුන් සමග කියවන්න.
- ස්වරප්‍රභේද අටෙහි ඒ ඒ ප්‍රභේදයට අයත් අකුරු විමසන්න.
- ඒ ඒ ස්වරප්‍රභේදය ප්‍රකාශ කොට ඒවා හුණු පුවරුවේ ලියා පෙන්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පෙළපොතෙහි 1.1 අභ්‍යාසයෙහි 1, 2 ද, ඇමුණුම 2 අභ්‍යාසය ද කරවන්න.

## පියවර 2

- ඇමුණුම 1 හි ඇති ව්‍යඤ්ජන කියවන්න.
- ව්‍යඤ්ජනවල ඇති ප්‍රභේද ගණන සිසුන්ගෙන් විමසන්න.
- ව්‍යඤ්ජන ප්‍රභේද සිසුන් සමග කියවන්න.
- ඒ ඒ ප්‍රභේදවලට අයත් ව්‍යඤ්ජන අකුරු විස්තර කරන්න.
- ව්‍යඤ්ජන ප්‍රභේදයක් ප්‍රකාශ කොට එක් එක් සිසුවා හුණු පුවරුව වෙත කැඳවා එය ලිවීමට උපදෙස් දෙන්න.
- පෙළපොතෙහි 1.1 අභ්‍යාසයේ 3, 4, 5 සහ 6 සිසුන් ලවා කරවන්න.
- සිසුන් දෙපිලකට බෙදා ප්‍රශ්න විචාරාත්මක තරගයක් මගින් ඒ ඒ ව්‍යඤ්ජන ප්‍රභේදවලට අයත් අකුරු විමසන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටක් ඇති බව ප්‍රකාශ කර නම් කිරීම
- දේවනාගරී හෝඩියේ ස්වරාක්ෂර ප්‍රභේද අටට ඇතුළත් වචන කියවීම; ලිවීම
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහක් ඇති බව ප්‍රකාශ කොට නම් කිරීම
- දේවනාගරී හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද දොළහ ඇතුළත් වචන කියවීම; ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් - 1 හා 2
- සංස්කෘත භාෂාව - තෙවන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

| | ස්වර අක්ෂරමාලාවේ විවිධ බෙදීම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ස්වරප්‍රභේද | | | | | | | | සවර්ණ |
| 01) හ්‍රස්ව 5 | | | | | | | | अ + आ |
| 02) දීර්ඝ 10 | | | | | | | | इ + ई |
| 03) ප්ලුත* | | | | | | | | उ + ऊ |
| 04) සන්ධ්‍යක්ෂර 04 | | අනාමින් | නාමින් | | | | | ऋ + ॠ |
| 05) නාමින් 12 | | | | | | | | ऌ + ॡ<br>අකුරක සවර්ණ අවස්ථා |
| 06) අනාමින් 02 | හ්‍රස්ව/සමාන - | अ | इ | उ | ऋ | ऌ | සවර්ණ | अ + अ = आ |
| 07) සමාන 05 | දීර්ඝ - | आ | ई | ऊ | ॠ | ॡ | | अ + आ = आ |
| 08) සවර්ණ 10 | සන්ධ්‍යක්ෂර - | | ए | ऐ | ओ | औ | | आ + अ = आ |
| | | | | | | | | आ + आ = आ |

* **ප්ලුතය** දැක්වීමට අක්ෂර රූප නැත. භාෂණයේ දී පහත අවස්ථාවල භාවිත වේ.
1. ගායනය 2. හැඬීම 3. ප්‍රශ්නවිචාරය 4. දුර සිටින කෙනකු කැඳවීම

* दूरादाह्वाने गाने रोदने विचारे गम्यमाने च टेः प्लुतो भवति।

| ව්‍යඤ්ජන අක්ෂරමාලාවේ විවිධ බෙදීම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| | අඝෝෂ | | ඝෝෂ | | | |
| | අල්පප්‍රාණ | මහාප්‍රාණ | අල්පප්‍රාණ | මහාප්‍රාණ | වර්ගාන්ත නාසිකා | ව්‍යඤ්ජනප්‍රභේද |
| ක වර්ග | क | ख | ग | घ | ङ | 1) වර්ගාක්ෂර - 25 |
| ච වර්ග | च | छ | ज | झ | ञ | 2) අඝෝෂ - 13 |
| ට වර්ග | ट | ठ | ड | ढ | ण | 3) ඝෝෂ - 20 |
| ත වර්ග | त | थ | द | ध | न | 4) අල්පප්‍රාණ - 10 |
| ප වර්ග | प | फ | ब | भ | म | 5) මහාප්‍රාණ - 10 |
| | අල්පප්‍රාණ | | අල්පප්‍රාණ | | | 6) වර්ගමූල - 05 |
| අන්තඃස්ථ | | | य | व | र ल | 7) වර්ගාන්ත - 05 |
| ඌෂ්මන් | श ष स | | ह | | | 8) අනුනාසිකා - 05 |
| අනුස්වාර | ं – (अं) | | | | | 9) අන්තඃස්ථ - 04 |
| විසර්ග | ः – (अः) | | | | | 10) ඌෂ්මන් - 04 |
| | | | | | | 11) අනුස්වාර - 01 |
| | | | | | | 12) විසර්ග - 01 |

ඇමුණුම 2

අදාළ අක්ෂර යොදා හිස්තැන් පුරවන්න.

| 1. | 2. | 3. | 4. | සංස්කෘත භාෂාවේ ස්වර දහහතර | 5. | 6. | 7. | 8. |
|---|---|---|---|---|---|---|---|---|
| හ්‍රස්ව | දීර්ඝ | සවර්ණ | ප්ලුත අවස්ථා | | සන්ධ්‍යක්ෂර | සමාන | නාමින් | අනාමින් |
| | | | | अ आ इ ई<br>उ ऊ ऋ ॠ<br>ऌ ॡ ए ऐ<br>ओ औ | | | | |

# පාඩම 2 - දේවනාගරී අක්‍ෂරමාලාව - ii

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්‍ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 දේවනාගරී අක්‍ෂරමාලාවේ උත්පත්ති ස්ථාන පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨ කටපාඩමින් ප්‍රකාශ කරයි; ලියයි.
- සංස්කෘත භාෂාවෙන් දැක්වෙන අක්‍ෂර උප්පත්ති ස්ථාන සිංහලෙන් හඳුන්වා දෙයි.
- අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ .... යනාදි පාඨවලට අයත් අකුරු සියල්ල ලියා පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පහත දැක්වෙන **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .... යනාදි පාඨ **සාරස්වතය ග්‍රන්ථයෙන්** සිසුන්ට පෙන්වන්න.

  **अकुहविसर्जनीयानां कण्ठः। इचुयशानां तालु। ऋटुरषाणां मूर्धा। ऌतुलसानां दन्तः। उपूपध्मानीयानामोष्ठौ। ञमङणनानां नासिका च। एदैतोः कण्ठतालु। ओदौतोः कण्ठौष्ठम्। वकारस्य दन्तौष्ठम्।**
- එම පාඨ සිසුන් සමග හඬනගා කියවන්න.
- මෙම පාඨවලින් දැක්වෙන්නේ සංස්කෘත භාෂාවේ අක්‍ෂර උත්පත්ති ස්ථාන බව සිසුන්ට පහදා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 1 සිසුන්ට සපයා එහි ඇති 1 සිට 4 දක්වා ඇති සූත්‍රපාඨ සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- ඒවා වාචෝද්ගත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- වගුවේ අඩංගු ඒ ඒ සූත්‍රයට අදාළ අකුරු පිළිවෙළින් සිසුන්ට පහදා දෙන්න.
- ඒ ඒ සූත්‍රපාඨ ප්‍රකාශ කර අදාළ අකුරු විමසන්න.
- අක්ෂර උත්පත්ති ස්ථානවලට යෙදෙන සිංහල අර්ථ පැහැදිලි කරන්න.
- අක්ෂර උත්පත්ති ස්ථාන ප්‍රකාශ කොට කියවන විට ලිවීමට හුරු කරන්න.

## පියවර 2

- **ඇමුණුම** 1 හි ඇති අංක 5 සිට අංක 9 දක්වා ඇති සූත්‍රපාඨ සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- සූත්‍රපාඨවලට අදාළ අකුරු උපුටා දක්වන්න.
- සංස්කෘත අක්ෂර උත්පත්ති ස්ථානවලට යෙදෙන සිංහල අර්ථ පැහැදිලි කර දෙන්න. (උදාඃ- කණ්ඨ - උගුර)
- ඇමුණුම 2 අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ ...** යනාදි පාඨ 09 කට පාඩමින් ප්‍රකාශ කිරීම හා ලිවීම
- **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ ....** යනාදි පාඨවලට අයත් අකුරු සියල්ල ලියා පෙන්වීම
- සංස්කෘත භාෂාවෙන් දක්වෙන අක්‍ෂර උත්පත්ති ස්ථාන සිංහලෙන් හඳුන්වා දීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම - 1 සහ 2
- සංස්කෘත භාෂාව - නෙවන ශ්‍රේණිය, පෙළපොත
- සාරස්වතය

ඇමුණුම - 1

## අක්ෂර උත්පත්ති ස්ථාන

| | | | |
|---|---|---|---|
| १ | अकुहविसर्जनीयानां कण्ठः। | अ आ क ख ग घ ङ ह ः | කණ්ඨ (උගුර) |
| २ | इचुयशानां तालु। | इ ई च छ ज झ ञ य श | තාලු (තල්ල) |
| ३ | ऋटुरषाणां मूर्धा। | ऋ ॠ ट ठ ड ढ ण र ष | මූර්ධ (මුදුන) |
| ४ | ऌतुलसानां दन्तः। | ऌ ॡ त थ द ध न ल स | දන්ත (දත්) |
| ५ | उपूपध्मानीयानामोष्ठौ। | ᳵ उ ऊ प फ ब भ म | ඕෂ්ඨ (තොල්) |
| ६ | ञमङणनानां नासिका च | ङ ञ ण न म | නාසිකා (නාසය) |
| ७ | एदैतोः कण्ठतालु। | ए ऐ | කණ්ඨ තාලු |
| ८ | ओदौतोः कण्ठौष्ठम्। | ओ औ | කණ්ඨ ඕෂ්ඨ |
| ९ | वकारस्य दन्तौष्ठम्। | व | දන්ත ඕෂ්ඨ |

ඇමුණුම - 2

01. අක්ෂර උත්පත්ති ස්ථානවලට අයත් අකුරු සහ ඒවාට අදාළ සූත්‍ර ලියන්න.

| අකුරු | සූත්‍ර | උත්පත්ති ස්ථාන |
|---|---|---|
| | | දන්තජ |
| | | දන්ත ඕෂ්ඨ |
| | | තාලුජ |
| | | කණ්ඨ තාලු |
| | | කණ්ඨජ |
| | | කණ්ඨ ඕෂ්ඨ |
| | | මූර්ධජ |
| | | නාසික |
| | | ඕෂ්ඨජ |

02. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. දීර්ඝ අකුරු පමණක් අයත් වරණය වන්නේ,

१. अ आ ई ऊ ॠ।　　२. आ ई ऊ ॠ ॡ।　　३. आ इ ऊ ॠ ॡ।

2. අඝෝෂාක්ෂර පමණක් අයත් වරණය වන්නේ,

१. ग ज ड द ब।　　२. क च ट त प।　　३. ङ ञ न ण म।

3. සන්ධ්‍යක්ෂර අයත් වන්නේ,

(1) හ්‍රස්වවලට ය.　　(2) දීර්ඝවලට ය.　　(3) අනාමින්වලට ය.

4. සංස්කෘත භාෂාවේ බිංදුව හඳුන්වන්නේ,

(1) නිග්ගහීතය නමිනි.　　(2) අනුස්වාරය නමිනි.　　(3) විසර්ගය නමිනි.

5. ව්‍යඤ්ජනවල क සිට म දක්වා අකුරු

(1) වර්ගාක්ෂර යි.　　(2) ඝෝෂාක්ෂර යි.　　(3) අඝෝෂාක්ෂර යි.

6. වර්ගාන්ත අක්ෂරවලින් එක් අක්ෂරයක් හෝ යෙදී ඇති වචනය කුමක් ද?

१. अचल।　　२. धवल।　　३. कनक।

7. ඌෂ්මන් අක්ෂරවලින් එක් අක්ෂරයක් හෝ යෙදී ඇති වචනය කුමක් ද?

१. अचल　　२. धवल　　३. चषक

8. 'ද්‍ය' යන්න සංයුක්තාක්ෂරවලින් ලියූ විට,

१. घ।　　२. ध।　　३. द्य।

9. वालुकायाम् යන වචනය අයත් වන්නේ,

(1) ඒකවචනයට ය.　　(2) ද්විවචනයට ය.　　(3) බහුවචනයට ය.

10. प्रीणयन्तु යන්නෙහි ලකාරය කුමක් ද?

(1) ලෝට් ලකාරය　　(2) ලට් ලකාරය　　(3) ලඞ් ලකාරය

11. पठ යන පදය අයත්වන ලකාරය වන්නේ,

(1) ලට් ලකාරය යි.　　(2) ලෝට් ලකාරය යි.　　(3) ලඞ් ලකාරය යි.

12. **अपतताम्** යන පදය අයත්වන ලකාරය වන්නේ,

(1) ලට් ලකාරය යි. (2) ලෝට් ලකාරය යි. (3) ලඞ් ලකාරය යි.

13. පිළිවෙළින් **ලට්, ලඞ්, ලෘට්** යන ලකාර තුනට අයත් ක්‍රියාපද අයත් වරණය කුමක් ද?

१. पठति, अपठत्, पठिष्यति ।

२. पठति, पठिष्यति, अपठत् ।

३. अपठत्, पठिष्यति, पठति ।

14. **आवाम्** යන උක්තපදයට ගැළපෙන ආඛ්‍යාතපදය තෝරන්න.

१. पठामः २. पठथः ३. पठावः

15. **अहम्** යන උක්තපදයට ගැළපෙන ආඛ්‍යාතපදය තෝරන්න.

१. जयानि । २. जयाव । ३. जयाम ।

16. **गायतः** යන වර්තමාන ක්‍රියාවට ගැළපෙන අනාගත ක්‍රියාරූපය තෝරන්න.

१. गायताम् । २. गायथः । ३. गायिष्यतः ।

17. .................. **जातिकगीतं गायथ** । මෙහි හිස්තැනට ගැළපෙන උක්තපදය කුමක් ද?

१. यूयम् २. त्वम् ३. युवाम्

18. .................. **आकाशे डयते** । මෙහි හිස්තැනට ගැළපෙන උක්තපදය කුමක් ද?

१. शकुनः । २. शकुनौ । ३. शकुनाः ।

19. **वार्ता** යන පදයට ගැළපෙන නිවැරදි විශේෂණ පදය තෝරන්න.

१. सः २. सा ३. ताः

20. **दशशीलमातरः** යන පදයට ගැළපෙන නිවැරදි විශේෂණ පදය තෝරන්න.

१. सः । २. ताः । ३. सा ।

21. **त्वं ............ हस्तेन लिखसि** ? යන වාක්‍යයේ හිස්තැනට අදාළ පදය තෝරන්න.

१. कस्य २. कया ३. केन

22. ස්වර සන්ධියේ ඇති ප්‍රභේද ගණන වන්නේ,

(1) හතකි. (2) අටකි. (3) නවයකි.

23. සංස්කෘත භාෂාවේ ඇති සමාස ප්‍රභේද සංඛ්‍යාව වන්නේ,

(1) හයකි. (2) හතකි. (3) අටකි.

24. '**ඓකපද්‍යං, ඓකස්වර්‍යං එකවිභක්තිකත්වං ච**' යනුවෙන් හඳුන්වන්නේ,

(1) සමාසයේ ප්‍රයෝජන යි.

(2) සන්ධියේ ප්‍රයෝජන යි.

(3) තද්ධිතයේ ප්‍රයෝජන යි.

25. අව්‍යය කෘදන්ත ගණයට අයත් වන්නේ,

(1) සමාස යි. (2) තුමන්තක්‍රියා යි. (3) තද්ධිත යි.

26. සංස්කෘත භාෂාවේ තද්ධිත ප්‍රභේද සංඛ්‍යාව වන්නේ,

(1) හයකි. (2) හතකි. (3) අටකි.

27. පහත ක්‍රියාපද අතුරින් තුමන්ත ක්‍රියාපදය තෝරන්න.

१. ज्ञातुम्। २. ज्ञायते। ३. ज्ञात्वा।

28. '**ගොස්**' යන පූර්වක්‍රියාවේ නිවැරදි සංස්කෘත රූපය වන්නේ,

१. गच्छन्। २. गच्छित्वा। ३. गत्वा।

29. හිතෝපදේශ කතුවරයාගේ නම කුමක් ද?

(1) නාරායණ ශර්මන් (2) සුදර්ශන (3) සුමංගල නාහිමි

30. හිතෝපදේශය අයත් වන්නේ,

(1) ශතකකාව්‍ය ගණයට ය.

(2) උපදේශකාව්‍ය ගණයට ය.

(3) මහාකාව්‍ය ගණයට ය.

# පාඩම 3 - නාමපද

**නිපුණතාව** : 2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 සර්වනාම නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- සර්වනාම යනු මොනවාදැයි නිදසුන් සහිත ව පහදයි.
- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම ප්‍රකාශ කරයි.
- මාතෘභාෂාවේ එදිනෙදා භාවිත කරන සර්වනාම සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරයි.
- එදිනෙදා ජීවිතයේ දී සර්වනාම යෙදෙන ආකාරය නිදසුන් සහිත ව ප්‍රකාශ කරයි.
- විශේෂණපද වශයෙන් සර්වනාම යෙදෙන අවස්ථා ගෙනහැර දක්වයි.
- නාමපද වෙනුවට සර්වනාම යෝජනය කරමින් වාක්‍යනිර්මාණය කරයි.
- වාක්‍යවල ඇති ලිඞ්ගත්‍රයට අයත් නාමපද වෙනුවට සුදුසු සර්වනාමපද යොදයි.
- අදාළ ශබ්ද සැලකිල්ලට ගනිමින් දෙනු ලබන සර්වනාමපද පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග වශයෙන් වර්ග කරයි.
- අදාළ ශබ්ද සැලකිල්ලට ගනිමින් දෙනු ලබන පුංලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග සහ නපුංසකලිඞ්ග සර්වනාමපද වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- නාමපදයක් වෙනුවට යොදන පද සර්වනාමපද නම් වන බව කියා දෙන්න.
- පෙළපොතේ 08 පාඩමේ ඇති සර්වනාම සහිත ඡේදය කියවීමට සිසුන් යොමු කරන්න.
- එම ඡේදය ඇසුරෙන් සර්වනාම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- පහත දැක්වෙන සර්වනාම යොදා ගනිමින් සර්වනාම යනු මොනවාදැයි හඳුන්වා දෙන්න.

**सर्व** (සියලු), **उभय** (දෙදෙන), **अन्य** (අනෙක්), **अन्यतर** (එක්තරා),
**एक** (එක්), **पूर्व** (පෙර), **दक्षिण** (දකුණු දිග), **यद्** (යම්),
**किम्** (කුමක්)

- එදිනෙදා භාවිත කරන සර්වනාම, විශේෂණපද වශයෙන් යෙදෙන අවස්ථා පහත නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

१. नमः सर्वेभ्यः बुद्धेभ्यः।
२. सर्वेषां पशूनां नायकः सिंहः।
३. सर्वे संस्काराः अनित्याः।
४. अयं मुनिः अस्मिन् आश्रमे वसति।
५. इमौ वृषभौ तृणं खादतः।
६. अस्य पुरुषस्य पुत्रः नगरं गच्छति।
७. आसु नदीषु बहवः जनाः स्नान्ति।
८. कः सौन्दरनन्दकाव्यं अकरोत्।
९. राहुलकुमारः कस्य पुत्रः।
१०. का वनिता अस्य बालकस्य माता।

- නාමපදයක් වෙනුවට සර්වනාමපදයක් යොදන ආකාරය පහත නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

१. बालकः पाठालयं गच्छति। सः रथेन गच्छति।
२. उपासिकाः पर्णशालां गच्छन्ति। ताः धर्मं श्रुण्वन्ति।
३. लेखकाः पुस्तकानि रचयन्ति। ते तानि पाठयन्ति।
४. इदं चित्रं पश्य। तं विचित्रम्।
५. कर्षकौ क्षेत्रं गच्छतः। तौ कर्षतः।

- ඇමුණුම 1හි අඩංගු මකාරාන්ත පුංලිඞ්ග '**ඉදම්**' ශබ්දය සිසුන් ලවා පාඩම් කරවන්න.

## පියවර 2

- **अस्मद्** / **युष्मद्** ශබ්ද දෙක පුද්ගලවාචී සර්වනාම බවත්, රූප වශයෙන් ලිඞ්ගත්‍රයෙහි ම එක සමාන වන බැවින් ඒවා අලිඞ්ගික නාම ලෙස සැලකෙන බවත්, පෙන්වා දෙන්න.
- පෙළපොතේ ඇති **अस्मद्** / **युष्मद्** ශබ්ද හා **तद्** ශබ්ද වනපොත් කිරීමට සිසුන් යොමු කරන්න.
- **अस्मद्** / **युष्मद्** ශබ්ද හා **तद्** ශබ්ද වාක්‍යවල යෙදෙන ආකාරය පහත නිදසුන් ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

१. सः बालकः वृक्षं आरोहति।
२. नमः तस्मै सम्बुद्धाय।
३. तस्य बालकस्य हस्ते पुस्तकम् अस्ति।
४. तासु वापीषु बहूनि पद्मानि सन्ति।
५. तौ बालकौ अङ्गने क्रीडतः।
६. ताः नार्यः वनात् दारूणि आहरन्ति।
७. अहं शिष्यः अस्मि।
८. गुरुः युष्मान् उपदिशति।
९. आवयोः पिता ग्रामे वसति।
१०. त्वं विहारं गच्छ।

- ඇමුණුම 2 අභ්‍යාසය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- මාතෘභාෂාවේ ඇති සර්වනාම ප්‍රකාශ කිරීම
- එදිනෙදා ජීවිතයේ දී සර්වනාම යෙදෙන අවස්ථාවලට නිදසුන් දැක්වීම
- විශේෂණපද වශයෙන් සර්වනාම යෝජනය කරමින් වාක්‍ය නිර්මාණය කිරීම
- වාක්‍යවල ලිඞ්ගත්‍රයට අදාළ නාමපද වෙනුවට සර්වනාමපද යෙදීම
- දෙනු ලබන ශබ්ද සමූහයක් ලිඞ්ගත්‍රයෙහි ලා වර්ග කිරීම
- දෙනු ලබන ශබ්ද ලිඞ්ගත්‍රයට අනුව වරනැගීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත භාෂාව - නවන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

**මකාරාන්ත පුංලිඞ්ග इदम् ශබ්දය**

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | अयम् | इमौ | इमे |
| द्वितीया | इमम् | इमौ | इमान् |
| तृतीया | अनेन | आभ्याम् | एभिः |
| चतुर्थी | अस्मै | आभ्याम् | एभ्यः |
| पञ्चमी | अस्मात् | आभ्याम् | एभ्यः |
| षष्ठी | अस्य | अनयोः | एषाम् |
| सप्तमी | अस्मिन् | अनयोः | एषु |

(අ) පහත සඳහන් නපුංසකලිඞ්ග **तद्** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | तत् | ते | तानि |
| द्वितीया | | ते | |
| तृतीया | तेन | | तैः |
| चतुर्थी | | ताभ्याम् | तेभ्यः |
| पञ्चमी | तस्मात् | ताभ्याम् | |
| षष्ठी | | तयोः | |
| सप्तमी | तस्मिन् | | तेषु |

(ආ) පහත සඳහන් **अस्मद्** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | अहम् | आवाम् | वयम् |
| द्वितीया | | आवाम् | |
| तृतीया | मया | | अस्माभिः |
| चतुर्थी | | | अस्मभ्यम् |
| पञ्चमी | मत् | आवाभ्याम् | अस्मत् |
| षष्ठी | | आवयोः | |
| सप्तमी | मयि | आवयोः | |

# පාඩම 4 - ආඛ්‍යාතපද

**නිපුණතාව** : 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1 ආඛ්‍යාතවල ධාතුමූලය වෙන් කරයි.
3.2 ලට්, ලඞ් සහ ලෝට් ලකාර උභය පදයෙහි සහ නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල :**

- දෙනු ලබන ආඛ්‍යාතපදයක (අවසාන ක්‍රියාපදයක) ධාතුමූලය ඉස්මතු කර පෙන්වයි.
- දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් පරස්මෛපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.
- දෙනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද ප්‍රත්‍ය වෙන් කර පෙන්වයි.
- දෙනු ලබන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ් හා ලෝට් ආත්මනේපද යෝජනා කරයි.
- ලට්, ලඞ් හා ලෝට් යන ලකාර තුනෙහි උභයපදයට අදාළ ව ධාතු වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

**ප්‍රවේශය :**

- පහත වාක්‍යවල ඉරි ඇඳි පද කුමන ක්‍රියාපද වර්ගයට අයත් වන්නේ දැයි විමසමින් පළමුවන වාක්‍යයේ ක්‍රියාපදය ආශිර්වාද ක්‍රියා ලෙසත්, දෙවන වාක්‍යයේ ක්‍රියාපදය විධික්‍රියා ලෙසත් හඳුන්වා දෙන්න.
- ඒවායේ ධාතුමූලය ඉස්මතු කර පෙන්වන්න.
- එවැනි වෙනත් නිදසුන් ඉදිරිපත් කරමින් ක්‍රියාපද පිළිබඳ දැනුවත් වීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- **देवः वर्षतु कालेन । राजा भवतु धार्मिकः ।**
  (කලට වැසි වසීවා!.... රජු දැහැමි වේවා!)
- **सत्यं वद । धर्मे चर ।**
  (ඇත්ත කියන්න, ධර්මයෙහි හැසිරෙන්න.)

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- පෙර ශ්‍රේණිවල දී ඉගෙන ගත් ලට් හා ලඞ් පරස්මෛපද ප්‍රත්‍ය හා ක්‍රියාපද සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඒවායේ ධාතුමූලය වෙන් කර පෙන්වන්න.
- ඒවා වරනැගීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 1හි ඇති ලට් ලකාර ආත්මනේපද ධාතූන් වරනැගෙන වගුව සිසුන්ට ලබා දෙන්න.
- ඒවා නිවැරදි ව උච්චාරණය කරමින් කට පාඩම් කිරීමට සිසුන් යොමු කරවන්න.
- පරස්මෛපද, ආත්මනේපද හා උභයපද වශයෙන් ධාතු වර්ගත්‍රයක් ඇති බවත්, ඵලය කර්තෘට නොව අනෙකෙකුට වේ නම් එකී ක්‍රියාවන්ගේ ධාතු පරස්මෛපද කොටසට ද, යම් ක්‍රියාවක ඵලය කර්තෘ වෙත ම ලැබේ නම් එම ක්‍රියාවන්ගේ ධාතු ආත්මනේපද කොටසට ද, කිසියම් ක්‍රියාවක් මෙම දෙකෙහි ම වේ නම් එය උභයපද කොටසට ද අයත් වන ආකාරය පිළිබඳ පහත නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

| | | | |
|---|---|---|---|
| ➢ कृ | ධාතුව උභයපදයෙහි ම යෙදේ. | करोति । | कुरुते । |
| ➢ पच् | ධාතුව උභයපදයෙහි ම යෙදේ. | पचति । | पचते । |
| ➢ याच् | ධාතුව උභයපදයෙහි ම යෙදේ. | याचति । | याचते । |
| ➢ लिख् | ධාතුව පරස්මෛපදයෙහි පමණක් යෙදේ. | लिखति । | ~~लिखते ।~~ |
| ➢ पठ् | ධාතුව පරස්මෛපදයෙහි පමණක් යෙදේ. | पठति । | ~~पठते ।~~ |
| ➢ चल् | ධාතුව පරස්මෛපදයෙහි පමණක් යෙදේ. | चलति । | ~~चलते ।~~ |
| ➢ लभ् | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~लभति ।~~ | लभते । |
| ➢ भाष् | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~भाषति ।~~ | भाषते । |
| ➢ डी | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~डयति ।~~ | डयते । |
| ➢ सेव् | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~सेवति ।~~ | सेवते । |
| ➢ वृत् | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~वर्तति ।~~ | वर्तते । |
| ➢ वृध् | ධාතුව ආත්මනේපදයෙහි පමණක් යෙදේ. | ~~वर्धति ।~~ | वर्धते । |

- ඇමුණුම 2හි ඇති ලෝට් ලකාර ධාතූන් වරනැගෙන වගුව සිසුන් වෙත ලබා දෙන්න. එම වරනැගීම නිවැරදි ව උච්චාරණය කරමින් කටපාඩම් කිරීමට සිසුන් යොමු කරවන්න.
- පහත දැක්වෙන් නිදසුන් යොදා ගනිමින් ලෝට් ලකාරය ආශීර්වාද හා විධාන අර්ථ (ප්‍රේරණාර්ථ) සඳහා යෙදෙන බව පෙන්වා දෙන්න.

  **१. सर्वे जनाः सुखिनः भवन्तु ।** සියලු ජනයෝ සැප ඇත්තෝ වෙත්වා !

  **२. त्वं बहिः गच्छ ।** ඔබ පිටතට යන්න.

### පියවර 2

- පහත සඳහන් ආකාරයට එක් සරල වාක්‍යයක් ලට්, ලඞ් හා ලෝට් ලකාරවල යෙදෙන ආකාරය පෙන්වා දෙන්න.
- එවැනි වෙනත් වාක්‍යනිර්මාණයට සිසුන් යොමු කරවන්න.

  १. छात्रः पुस्तकं पठति । (ශිෂ්‍යයා පොත හදාරයි.)

  २. छात्रः पुस्तकं अपठत् । (ශිෂ්‍යයා පොත හැදෑරුවේ ය.)

  ३. छात्रः पुस्तकं पठतु । (ශිෂ්‍යයා පොත හදාරාවා!)

- පෙළපොතෙහි සහ සංස්කෘත පාඨමාලා 2හි සඳහන් ලට්, ලඞ් සහ ලෝට් යන ලකාරවලට අදාළ අභ්‍යාසත්, ඇමුණුම 3 අභ්‍යාසයත් සිසුන් ලවා කරවන්න.

### මූලික වදන් සංකල්ප :

- ලෝට් ලකාරය - ප්‍රාර්ථනාර්ථ
- පරස්මෛපද, ආත්මනේපද හා උභයපද

### ඇගයීම හා තක්සේරුකරණය :

- දෙනු ලබන ආඛ්‍යාතපදයක ලකාරයට අනුව ධාතුමූලය හා ප්‍රත්‍යය වෙන් වෙන් ව ප්‍රකාශ කිරීම
- උභයපද වශයෙන් පරස්මෛපද සහ ආත්මනේපද යන ධාතු වර්ගය නම් කිරීම
- ලට්, ලඞ් හා ලෝට් යන ලකාර තුනෙහි උභයපදයට අදාළ ව, ධාතු වරනගා උචිත පරිදි භාවිත කිරීම
- සුදුසු ලට්, ලඞ් හා ලෝට් ආඛ්‍යාතපද යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- පුරුෂ හා වචනභේදයට අනුකූල ව සරල වාක්‍ය පරිවර්තනය කිරීම

### ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1, 2 සහ 3
- සංස්කෘත භාෂාව - තෙවන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා 3

ඇමුණුම 1

ලට් ලකාර ආත්මනේපද ප්‍රත්‍යයන් සහ භාෂ් ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ते | एते | न्ते | भाषते | भाषेते | भाषन्ते |
| मध्यमपुरुष | से | एथे | ध्वे | भाषसे | भाषेथे | भाषध्वे |
| उत्तमपुरुष | ए | वहे | महे | भाषे | भाषावहे | भाषामहे |

ඇමුණුම 2

ලෝට් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ පඨ් ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | तु | ताम् | अन्तु | पठतु<br>පාඩම් කරාවා | पठताम्<br>(දෙදෙන) පාඩම් කරත්වා | पठन्तु<br>පාඩම් කරත්වා |
| मध्यमपुरुष | [हि] | तम् | त | पठ<br>පාඩම් කරව | पठतम्<br>(දෙදෙන) පාඩම් කරවු | पठत<br>පාඩම් කරවු |
| उत्तमपुरुष | आनि | आव | आम | पठानि<br>පාඩම් කරම්වා | पठाव<br>(දෙදෙන) පාඩම් කරමෝවා | पठाम<br>පාඩම් කරමෝවා |

ඇමුණුම 3

01. (අ) √वस् ධාතුව (ප්‍රාර්ථනාර්ථ) ලෝට් ලකාර පරස්මෛපදයට අනුව පහත සඳහන් වගුව පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | वसतु | | वसन्तु |
| मध्यमपुरुष | | वसतम् | |
| उत्तमपुरुष | वसानि | | वसाम |

(ආ) √नम् ධාතුව ලෝට් ලකාර පරස්මෛපදයට අනුව පහත සඳහන් වගුව පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | नमतु | | नमन्तु |
| मध्यमपुरुष | | नमतम् | |
| उत्तमपुरुष | नमानि | | नमाम |

02. පහත ක්‍රියාපදවල අර්ථ ලියන්න.

i. नमथ ..........................................................................................

ii. पचति ..........................................................................................

iii. लिखामि ..........................................................................................

iv. अपूजयत् ..........................................................................................

v. भविष्यन्ति ..........................................................................................

vi. भवन्तु ..........................................................................................

vii. पठिष्यति ..........................................................................................

viii. रक्षतु ..........................................................................................

√नी ධාතුව ( **अनयत्** ) අතීතකාල (ලඞ්) පරස්මෛපදයෙහි වරනගා හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | | अनयताम् | |
| मध्यमपुरुष | | | अनयत |
| उत्तमपुरुष | अनयम् | | अनयाम |

√नी ධාතුව ( **नयति** ) වර්තමානකාල (ලට්) පරස්මෛපදයෙහි වරනගා හිස්තැන් පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | | नयतः | |
| मध्यमपुरुष | नयसि | | नयथ |
| उत्तमपुरुष | | | नयामः |

# පාඩම 5 - සන්ධි

**නිපුණතාව** : 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 ස්වරසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- ස්වරසන්ධිය සහිත වචන නම් කරයි.
- ස්වරසන්ධි ප්‍රභේද නම් කරයි.
- ස්වරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කර පෙන්වයි.
- ස්වරසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.
- ස්වරසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ස්වරසන්ධිය සහිත පද උපුටා දක්වයි.
- ස්වරසන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි. .

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පහත සඳහන් කවිපද දෙක සජ්ඣායනා කරවමින් එහි ඇති සන්ධිපද පිළිබඳ සාකච්ඡා කරන්න.
- '**රතැඟිලි** තුඩෙහි **සුවඳැති** **නිලුපුල** රන්දා
  **අදරැති** **ගුරුතුමෙනි** ඔබෙ පායුග වැන්දා'

- **नरस्याभरणं** रूपं - **रूपस्याभरणं** गुणः।
  **गुणस्याभरणं** ज्ञानं - **ज्ञानस्याभरणं** क्षमा ॥
  යන ශ්ලෝකය හුණු පුවරුවේ ලියා එකම ස්වරූපයකට පෙනෙන වචන හතරට ඉරි ගසා ශබ්දනගා සිසුන් ලවා කියවන්න.
- එම පද විසන්ධි කොට පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- 2 ශ්‍රේණියේ දී හඳුනාගත් සංස්කෘත භාෂාවේ තිබෙන ප්‍රධාන සන්ධි 5 සිසුන්ට සිහි ගන්වන්න.
- ඇමුණුම 1 සිසුන්ට ලබා දෙමින් පහත ආකාරයට ස්වරසන්ධියේ ප්‍රභේද අට පිළිවෙළින් විමසන්න.

| | |
|---|---|
| 1. දීර්ඝ සන්ධිය | 2. ගුණ සන්ධිය |
| 3. වෘද්ධි සන්ධිය | 4. ව්‍යස්ත සන්ධිය |
| 5. ලෝප සන්ධිය | 6. ලෝපශ් සන්ධිය |
| 7. ආදේශ සන්ධිය | 8. ආගම සන්ධිය |

- දීර්ඝ, ගුණ, වෘද්ධි, ව්‍යස්ත, ලෝප, ලෝපශ්, ආදේශ හා ආගම වශයෙන් ස්වරසන්ධියේ ප්‍රභේද 'සන්ධි' යන වචනය ඉවත් කොට එක පෙළට සිසුන් සමග කියවන්න.
- ඇමුණුම 1හි දක්වා ඇති ඒ ඒ සන්ධි ප්‍රභේදවලට නිදසුන් වශයෙන් දී ඇති සන්ධිපද විසන්ධි කිරීමටත් විසන්ධිපද සන්ධි කිරීමටත් සිසුන් යොමු කරන්න.
- එක් එක් සන්ධිප්‍රභේදය සිසු කණ්ඩායම්වලට පවරා දී පන්තියේ ප්‍රදර්ශනය කිරීමට දළ සටහනක් නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- ස්වරසන්ධිය
- දීර්ඝ, ගුණ, වෘද්ධි, ව්‍යස්ත, ලෝප, ලෝපශ්, ආදේශ හා ආගම ස්වරසන්ධි ප්‍රභේද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ස්වරසන්ධිය පැහැදිලි කිරීම
- ස්වරසන්ධියේ ප්‍රභේද නිවැරදි ව නම් කිරීම
- ස්වරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කිරීම
- ස්වරසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- දෙන ලද ස්වරසන්ධිපද විසන්ධි කිරීම, විසන්ධිපද සන්ධිකිරීම
- නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨවලින් ස්වරසන්ධි සහිත පද උපුටා දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් 1 සහ 2
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම තරඞ්ග)

## ඇමුණුම 1

(1) **දීර්ඝසන්ධිය:** සමාන ස්වර දෙකක් එකතැන පිහිටි කල්හි ඉන් එක් ස්වරයක් දීර්ඝයක් බවට පත් වේ. අවර්ණ දීර්ඝය, ඉවර්ණ දීර්ඝය, උවර්ණ දීර්ඝය, ඍවර්ණ දීර්ඝය, ඏවර්ණ දීර්ඝය වශයෙන් පස් ආකාර වේ.

අවර්ණ දීර්ඝය - උදා : सुर + असुर

सुर् + अ + असुर

सुर् + आ + सुर

सुरासुर

ඉවර්ණ දීර්ඝය - උදා : इति + इदम्

इत् + इ + इदम्

इत् + ई + दं

इतीदं

උවර්ණ දීර්ඝය - උදා : भानु + उदयः

भान् + उ + उदयः

भान् + ऊ + दयः

भानूदयः

ඍවර්ණ දීර්ඝය - උදා : पितृ + ऋ + णम्

पित् + ऋ + ऋणम्

पित् + ॠ + णम्

पितॄणम्

ඏවර්ණ දීර්ඝය - උදා : ॡ + ॡवर्णः

ॡवर्णः

(2) **ගුණසන්ධිය :** **ए ओ अर् अल्** යන අක්ෂරවලට ගුණ යන සංඥාව ලැබේ. ඉහත අකුරු ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය ගුණසන්ධිය නම් වේ.

(අරෙදො නාමිනො ගුණඃ)

එ ආදේශය - උදා : देव + इन्द्रः

देव् + अ + इन्द्रः

देव् + ए + न्द्रः

देवेन्द्रः

ඔ ආදේශය - උදා : चन्द्र + उदय

चन्द्र् + अ + उदय

चन्द्र् + ओ + दय

चन्द्रोदय

අර් ආදේශය - උදා : व्यास + ऋषिः

व्यास् + अ + ऋषिः

व्यास् + अर् + षिः

व्यासर्षिः

අල් ආදේශ - උදා : तव + ऌवर्ण

तव् + अ + ऌवर्ण

तव् + अल् + वर्ण

तवल्वर्ण

(3) **වෘද්ධිසන්ධිය :** **ऐ औ आर् आल्** යන අකුරු ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය වෘද්ධි සන්ධියයි. (ආරෛඖ වෘද්ධිඃ) වෘද්ධි අකුරු පහකි.

එහෙත් ආ කාරය මෙහි දී නොගැනේ.

ඓ ආදේශය - උදා:  नव + एव

नव् + अ + एव

नव् + ऐ + व

नवैव

ඖ ආදේශය - උදා:  मम + ओदनम्

मम् + अ + ओदनम्

मम् + औ + दनम्

ममौदनम्

ආර් ආදේශය - උදා:  शीत + ऋतः

शीत् + अ + ऋतः

शीत् + आर् + तः

शीतार्तः

ආල් ආදේශ - උදා :  कृता + ऌकृतिः

कृत् + आ + ऌकृतिः

कृत् + आल् + कृतिः

कृताल्कृतिः

(4) **ව්‍යස්තසන්ධිය :** **ए ऐ ओ औ** යන අකුරු සතරට **अय् आय् अव् आव्** යන අකුරු සතර ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය ව්‍යස්තසන්ධිය යි.

අය් ආදේශය - උදා :  ने + अनम्

न् + ए + अनम्

न् + अय् + अनम्

नयनम्

ආය් ආදේශය - උදා : नै + अकः

न् + ऐ + अकः

न् + आय् + अकः

नायकः

අව් ආදේශය - උදා : भो + अति

भ् + ओ + अति

भ् + अव् + अति

भवति

ආව් ආදේශය - උදා : भौ + अकः

भ् + औ + अकः

भ् + आव् + अकः

भावकः

(5) **ලෝපසන්ධිය :** පදාන්තයෙහි සිටි එකාරයෙන් ද, ඔකාරයෙන් ද පර වූ අකාරය ලොප්වේ. 'අ' වෙනුවට අවග්‍රහ (ऽ) ලකුණ යෙදීම සිදු වේ. (එදොතොතඃ)

| | |
|---|---|
| උදා : ते + अत्र | पठो + अत्र |
| ते + अ + अत्र | पठो + अ + त्र |
| तेऽत्र | पठोऽत्र |

(6) **ලෝපශ්සන්ධිය :** අකුරක් ලෝපශ් වීමෙන් සෑදෙන සන්ධිය ලෝපශ්සන්ධිය නම් වේ. ලෝපශ් ක්‍රමයෙන් ලොප් වූ විට සන්ධි නිමිත්තක් ඇතත් නැවත සන්ධි නොවීම ලක්ෂණය යි.

උදා : कुले + इति

कुले + य् + इति

कुले इति

(7) **ආදේශසන්ධිය :** අකුරක් වෙනුවට අකුරක් පැමිණවීම ආදේශ සන්ධිය යි.

මෙහි **इ उ ऋ ऌ ....** යන අකුරුවලට **ය ව ර ල** යන අන්තඃස්ථ අකුරු ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය ආදේශසන්ධිය නම් වේ. (ශත්‍රුවදාදේශඃ)

'**ය**' ආදේශය උදා : **इति + अहम्**

**इत् + इ + अहम्**

**इत् + य् + अहम्**

**इत्यहम्**

'**ව**' ආදේශය උදා : **मधु + अत्र**

**मध् + उ + अत्र**

**मध् + व् + अत्र**

**मध्वत्र**

'**ර**' ආදේශය උදා : **कर्तृ + अर्थः**

**कर्त् + ऋ + अर्थः**

**कर्त् + र् + अर्थः**

**कर्त्रर्थः**

'**ල**' ආදේශය උදා : **ऌ + औ**

**ल् + औ**

**लौ**

(8) **ආගමසන්ධිය :** තිබෙන අකුරුවලට හානි නොකොට අමුතුවෙන් ස්වරයක් පැමිණවීමෙන් ගැළපෙන සන්ධිය ආගමසන්ධිය නම් වේ. මෙහි ආගම සිදුවන්නේ සීමිත ශබ්ද කොටසකට පමණි. අක්‍ෂ, ඉන්‍ද්‍ර, අග්‍ර, අජින, ඊර, ඌහිණී, ඌඪ යන ශබ්දවලින් පර ව ආගම සිදුවේ. (මිත්‍රවදාගමඃ)

උදා : **गो + अक्षः**

**गो + अ + अक्षः**

**गव् + अ + अक्ष**

**गव् + आक्ष**

**गवाक्षः**

**गवेन्द्रः/ गवाग्रम् /गवाजिनम् /स्वैरम् /अक्षौहिणी /प्रौढः**

**ඇමුණුම 2**

01. සංස්කෘත භාෂාවේ ප්‍රධාන සන්ධි වර්ග 05 නම් කරන්න.

02. ස්වරසන්ධියේ ප්‍රභේද 08 නම් කරන්න.

03. පහත සඳහන වචනවලින් සුදුසු පරිදි වගුව පුරවන්න.

**मुनीन्द्रः / चन्द्रोदयः / इत्यहम् / कुले इति / हलीषा / प्रौढः / हरेऽहम् / गवेन्द्रः**

**इत्याह / तवेयम् / भानूदयः / महोदधिः / नयनम् / विद्यालय/ महौषधिः / तवैषा**

| සන්ධිවර්ගය | සන්ධිපද |
|---|---|
| 01. දීර්ඝසන්ධිය | |
| 02. ගුණසන්ධිය | |
| 03. වෘද්ධිසන්ධිය | |
| 04. ව්‍යස්තසන්ධිය | |
| 05. ලෝපසන්ධිය | |
| 06. ලෝපශ්සන්ධිය | |
| 07. ආදේශසන්ධිය | |
| 08. ආගමසන්ධිය | |

04. පහත වාක්‍යවල ඇති ස්වර සන්ධිපද උපුටා දක්වා විසන්ධි කරන්න.

१. बालकाः क्रीडाङ्गणे क्रीडन्ति ।

२. चित्रेऽस्मिन् एकः कुक्कुटः अस्ति ।

३. पूर्वे सुरासुरयोः संग्रामम् अभूत् ।

४. विनोदार्थम् अपि असत्यं न वक्तव्यम् ।

५. व्याघ्रः हिंस्राणां मृगाणां मध्येऽतीव क्रूरः ।

६. भानूदये शकुनाः कूजन्ति ।

७. शाक्यमुनीन्द्राय नमः ।

८. जम्बुद्वीपे गङ्गा नाम नदी आसीत् । ( नद्यासीत् )

९. देवानां राजा देवेन्द्रः ।

१०. महामहेन्द्र स्थविरः लङ्कां सम्प्राप्तः ।

११. प्रज्ञा एव नयनम् ।

१२. अद्य कठिनोत्सवम् ।

१३. अनुजस्य पुरतो अग्रजः भवति ।

१४. नाविकः समुद्रं तरति ।

१५. दमनकः करटकं इत्याह ।

# පාඩම 6 - සමාස

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- වෙන් වෙන් ව පවත්නා නාමපද දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතු කොට එක් නාම පදයක් වන ලෙස ගැළපීමෙන් සමාස නිර්මාණය වන බව ප්‍රකාශ කරයි.
- පහත දැක්වෙන සමාස නිදසුන් වශයෙන් දක්වයි.

  **වාචං වාචං ප්‍රති - ප්‍රතිවාචම්**

  **චීවරාය වස්ත්‍රම් - චීවරවස්ත්‍රම්**

  (සරල හා නිතර භාවිත වන නිදසුන් පමණක් දැක්වීම සෑහේ.)
- සංස්කෘත භාෂාවේ සමාස වර්ග 06 ක් ඇති බව ප්‍රකාශ කරයි.
- සමාස වර්ග හය නම් කරයි.
- සමාසවලින් භාෂාවකට ඇති ප්‍රයෝජන විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 චිත්‍රය සිසුන්ට පෙන්වා සමාස හය පිළිවෙළින් නම් කරන්න.
- සමාස අනුපිළිවෙළින් නම් කිරීම වැදගත් වන බව පෙන්වා දෙන්න.
- සමාසවලින් ඇති ප්‍රයෝජන පහත ආකාරයට පැහැදිලි කරන්න.
  - පද වැඩි ගණනක් එක්පදයකින් දැක්විය හැකිවීම
  - එක්පදයක් වශයෙන් උච්චාරණය කළ හැකිවීම (සුබෝච්චාරණය)
  - එකවිභක්තියකින් අවසන් වීම

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- වෙන් වෙන් ව පවත්නා පද දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට එක් නාමපදයක් වන ලෙස ගැළපීම සමාස ලෙස හඳුන්වන බව සරල උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.
- සිංහල භාෂාවේ ද සමාස භාවිත වන බව පහත නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.

- ❖ කිරෙන් පිසූබත් - කිරිබත්
- ❖ වැඩ කරනුයේ - වැඩකරු
- ❖ අතින් කළ වැඩ - අත්කම්
- ❖ න කුසල් - අකුසල්

- සංස්කෘත භාෂාවේ ද එලෙස ම සමාස ඇති බව පහත නිදසුන් ඇසුරින් පෙන්වන්න.
  - ❖ **राज्ञः पुरुषः** = **राजपुरुषः ।**
  - ❖ **महन्तः च सः पुरुषः च** = **महापुरुषः।**
  - ❖ **माता च पिता च** = **मातापितरौ ।**
  - ❖ **नराणां इन्द्रः** = **नरेन्द्रः ।**

## පියවර 2

- පහත ආකාරයට සමාස හයක් ඇති බව නාමික ව හඳුන්වමින් ඒවා හුණුපුවරුවේ සටහන් කරන්න.

  i. අව්‍යයීභාවසමාසය

  ii. තත්පුරුෂසමාසය

  iii. ද්වන්ද්වසමාසය

  iv. බහුව්‍රීහිසමාසය

  v. කර්මධාරයසමාසය

  vi. ද්විගුසමාසය

- ඇමුණුම 2 සිසුන්ට ලබා දෙන්න.
- සාරස්වතය සහ සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණි (කාරක - සමාස - තද්ධිත තරඞ්ග) ග්‍රන්ථ වෙත සිසු අවධානය යොමු කරමින් ඇමුණුම 1හි ඇති කරුණු සාකච්ඡා කරන්න.
- ඇමුණුම 3 සිසුන්ට ලබා දී ඒ ඒ සමාසයට ඇති නිදසුන් වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට සමාස වර්ගය නම් කිරීමටත්, අනෙක් කණ්ඩායමින් තත්පර ගණනක් ඇතුළත ඊට නිදසුනක් ප්‍රකාශ කිරීමට හෝ හුණු පුවරුවේ ලිවීමටත්, අවස්ථාව දෙමින් තරගයක් පවත්වන්න.

### පියවර 3

- හිතෝපදේශයෙන් උපුටාගත් (ඇමුණුම් 4) කතන්දරය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි එන සමාස නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒ ඒ සමාසය යෙදීමෙන් ඇති වන භාෂාමය පහසුව සහ සාහිත්‍ය රසය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඉහත කරුණු පදනම් කර ගනිමින් භාෂාවකට සමාසවලින් සිදුවන මෙහෙය මතු කර පෙන්වන්න.
- ඇමුණුම 5 අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.


### ඇගයීම හා තක්සේරුකරණය :

- සමාස යනු කුමක් දැයි අර්ථකථනය කිරීම
- සමාස හය පිළිවෙළින් නම් කිරීම
- භාෂාවේ නිතර භාවිත වන සරල සමාසපද ඒ ඒ සමාස වර්ගය යටතේ ගොනු කර පෙන්වීම
- කතන්දරයක් ඇසුරෙන් සමාසපදවල ප්‍රයෝජන පැහැදිලි කිරීම

### ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1 චිත්‍රය
- සාරස්වතය සහ සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත තරඞ්ග)

ඇමුණුම 1



ඇමුණුම 2

| | | |
|---|---|---|
| අව්‍යයීභාවසමාසය<br>පූර්වෙ’ව්‍යයෙ’ව්‍යයීභාවඃ | ⟹ | अव्ययीभावसमास<br>पूर्वेव्ययेव्ययीभावः। |
| තත්පුරුෂසමාසය<br>අමාදෞ තත්පුරුෂඃ | ⟹ | तत्पुरुषसमास<br>अमादौ तत्पुरुषः। |
| කර්මධාරයසමාසය<br>කර්මධාරයස්තුල්‍යාර්ථෙ | ⟹ | कर्मधारयसमास<br>कर्मधारयस्तुल्यार्थे। |
| ද්විගුසමාසය<br>සංඛ්‍යාපූර්වො ද්විගුඃ | ⟹ | द्विगुसमास<br>संख्यापूर्वो द्विगुः। |
| ද්වන්ද්වසමාසය<br>චාර්ථෙ ද්වන්ද්වඃ | ⟹ | द्वन्द्वसमास<br>चार्थे द्वन्द्वः। |
| බහුව්‍රීහිසමාසය<br>බහුව්‍රීහිරන්‍යාර්ථෙ | ⟹ | बहुव्रीहिसमास<br>बहुव्रीहिरन्यार्थे। |

### अव्ययीभावसमास

- यथाशक्तिम्।
- उपनगरम् ।
- प्रतिवृक्षम् ।
- प्रतिवाचम् ।
- अधिस्त्रिम्।

### तत्पुरुषसमास

- धर्मारक्षितः।
- मासपूर्वः।
- यूपदारु।
- चोरभयम्।
- देवलोकः।

### कर्मधारयसमास

- महापुरुषः।
- नरसिंहः।
- शीतोष्णम्।
- रम्यलता।
- असुरः।

### द्विगुसमास

- पञ्चगु।
- त्रिरात्रम्।
- दशपद्मानि।
- पञ्चपात्रम्।
- दशग्रामी।
- द्वरात्रयं।

### द्वन्द्वसमास

- पाणिपादम्।
- पट्गुप्तौ।
- राजन्यरथाशं।
- हस्तपादौ।
- अग्निमारुतौ।
- रामरावणौ।

### बहुव्रीहिसमास

- लम्बकर्णः → क्षत्रियः।
- बहुधनः → प्रभुः।
- धर्मबुद्धिः → भिक्षुः।
- दशबलः → भगवान्।
- सशिष्यः → गुरुः।
- चन्द्रमुखः → कुमारः।

अस्ति मगधदेशे चम्पकवती नामारण्याणी। तस्यां चिरान्महता स्नेहेन मृगकाकौ निवसतः। स च मृगः स्वेच्छया भ्राम्यन् हृष्टपुष्टाङ्गः केनचिच्छृगालेनावलोकितः। तं दृष्टखेवा शृगालोऽचिन्तयत् - आः कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु विश्वासं तावदुत्पादयामि। इत्यालोच्योपसृत्याब्रवीत्- मित्र कुशलं ते मृगेणोक्तम् कस्त्वम् स ब्रूते- क्षुद्रबुद्धिनामा जम्बूकोऽहम्। अत्रारण्ये बन्धुहीनो मृतवदेकाकी वसामि। इदानीं त्वां मित्रमासाद्य पुनः सबन्धुर्जीवलोकं प्रविष्टोऽस्मि। अधुना तवानुचरेण मया सर्वथा भवितव्यम्। मृगेणोक्तम्- एवमस्तु। ततः पश्चादस्तंगते सवितरि भगवति मरीचिमालिनि तौ मृगस्य वासभूमिं गतौ। तत्र चम्पकवृक्षशाखायां सुबुद्धिनामा काको मृगस्य चिरमित्रं निवसति। तौ दृष्टखेवा काकोऽवदत्। सखे चित्राङ्ग कोऽयं द्वितीयः। मृगो ब्रूते - जम्बुकोऽयम्। अस्मत्सख्यमिच्छन्नागतः। काको ब्रूते- मित्र अकस्मादागन्तुना सह मैत्री न युक्ता।



01. සංස්කෘත භාෂාවේ සමාස 06 නම් කරන්න.

02. සාරස්වතයේ සමාස හඳුන්වා ඇති ආකාරය පෙන්වා සමාසපදයක් සෑදෙන අයුරු පැහැදිලි කරන්න.

03. පහත දක්වා ඇති විග්‍රහ වාක්‍යවලින් තැනෙන සමාසපද ලියන්න.

| | |
|---|---|
| वाचं वाचं प्रति | चोरात् भयम् |
| चीवराय वस्त्रम् | राज्ञः पुत्रः |
| ग्रामं गतः | देवानां लोकः |
| राज्ञा हतः | शारिपुत्रश्च सः स्थविरश्च |
| देवैः दत्तः | न सुरः |
| नरकं पतितः | न आगतः |

04. සමාස ප්‍රයෝජන ලියා දක්වන්න.

# පාඩම 7 - තද්ධිත

**නිපුණතාව** : 6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 තද්ධිතවර්ගවලට නිදසුන් දක්වයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- තද්ධිතවර්ග අට නම් කරයි.
- නිදසුන් වශයෙන් දී ඇති තද්ධිත වාක්‍යවල යොදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

**ප්‍රවේශය** :

- ඇමුණුම 1හි ඇති තද්ධිතපද 16න් කිහිපයක් හුණු පුවරුවේ ලියන්න.
- ඒවා සුබෝච්චාරණයට දායක වන අයුරු පෙන්වන්න.
- පහත සඳහන් මාතෘකාව පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**සංස්කෘත භාෂාවේ අලංකාරයට හා සුබෝච්චාරණයට 'තද්ධිත' උපකාර වෙයි.**

**පාඩම සංවර්ධනය** :

**පියවර 1**

- තද්ධිතවර්ග අට සහ ඒවාට උදාහරණ ඇතුළත් ඇමුණුම 1 වගුව සිසුන්ට සපයන්න.
- තද්ධිතවර්ග අට සිසුන් සමග ශබ්ද නගා නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවන්න.
- එක් එක් තද්ධිතවර්ගය ද, උදාහරණ පද ද, සිසුන්ට කීමට අවස්ථාවක් ලබා දෙන්න.
- වගුවේ අඩංගු තද්ධිතපද සරල වාක්‍යවලට යොදා පෙන්වන්න.
- වගුවේ අඩංගු තද්ධිතපද යොදා ගෙන එක් තද්ධිතවර්ගයකින් වාක්‍ය දෙක බැගින් නිර්මාණය කිරීමේ අභ්‍යාසයක සිසුන් නිරත කරවන්න.

**පියවර 2**

- පහත සඳහන් වාක්‍ය හුණු පුවරුවේ ලියා තද්ධිත යනු කවරේදැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.

  **'නාමපදවල අගට ප්‍රත්‍ය එකතු කිරීමෙන් නිපදවනු ලබන්නේ තද්ධිත නාමයෝ ය.'**
- තද්ධිත නාමයක් නිර්මාණය වන අයුරු පහත පරිදි සිදුවන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - නාමයක් අගට අර්ථ ප්‍රත්‍ය හෙවත් විශේෂ ප්‍රත්‍ය එකතු කරයි.
  - එම නිසා තද්ධිත ප්‍රත්‍යාර්ථ ගණයට අයත් වේ.
- ඇමුණුම 2 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

උදා:

- विदेहस्य अपत्यम्  (විග්‍රහ වාක්‍ය)
- विदेहस्य + अण्  (තද්ධිත ප්‍රත්‍ය යෙදීමෙනි)
- विदेह + अ  (ඉත් අකුරු හා විභක්ති ලෝපයෙනි)
- वैदेह + अ  (වෘද්ධි වීමෙනි)
- वैदेह् + अ  (පූර්වස්වර ලෝපය)
- वैदेह  (තද්ධිතනාමය)
- वैदेह + स्  (විභක්ති ප්‍රත්‍ය යෙදීමෙනි)
- वैदेहः  (විසර්ග ආදේශයකි)

**මූලික වදන් සංකල්ප :**

- තද්ධිත
- සුබෝච්චාරණය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- තද්ධිතවර්ග අට කටපාඩමින් ප්‍රකාශ කිරීම
- තද්ධිතවර්ග අටට නිදසුන් ඉදිරිපත් කිරීම
- තද්ධිතපද යොදා වාක්‍යනිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2

**ගුරුවරයාගේ පරිශීලනයට :**

- සාරස්වතය සහ සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත තරඞ්ග)

ඇමුණුම 1

| අංකය | තද්ධිත වර්ගය | තද්ධිත පද |
|---|---|---|
| 01. | अपत्यतद्धित | गौतम / शैव |
| 02. | भावतद्धित | ब्राह्मणता / मृदुता |
| 03. | अस्त्यर्थतद्धित | प्रज्ञा / जटिल |
| 04 | समूहार्थतद्धित | बन्धुता / गोत्रः |
| 05. | अतिशयार्थतद्धित | लघुतर / गुणियान् |
| 06. | अनेकार्थतद्धित | मागधः / नागरिक |
| 07. | संख्यातद्धित | दशमः / तृतीया |
| 08. | अव्ययतद्धित | यथा / तत्र |

ඇමුණුම 2

01. තද්ධිතවර්ග 08 නම් කරන්න.

02. පහත සඳහන් තද්ධිතපදවල නාමය දක්වන්න.

**उत्तर / ब्राह्मणता / भगवान् / पापतर / गौतम / बन्धुता / मागध / द्वितीय**

# පාඩම 8 - කෘදන්ත

**නිපුණතාව** : 7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 කෘදන්ත පිළිබඳ දැනුවත් බව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත භාෂාවේ ඇති කෘදන්ත 11 අතුරින් ත්‍රෛකාලික, අතීත, වර්තමාන, අනාගත, අව්‍යය, භාව සහ ස්ත්‍රී යන කෘදන්ත හත වාචෝද්ගත ව නම් කරයි.
- දෙනු ලබන කෘදන්තවර්ග හත සටහනකින් ඉදිරිපත් කරයි.
- අව්‍යයකෘදන්තවල ප්‍රභේද දෙකක් ලෙස තුමන්තක්‍රියා සහ පූර්වක්‍රියා නම් කරයි.
- ඉහත සියලු ම කෘදන්ත නියමිත ප්‍රත්‍ය යෙදීමෙන් සැදෙන ආකාරය පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම අංක 1 සටහන සිසුන්ට ඉදිරිපත් කරන්න.
- කෘදන්තයක් ගොඩනැගෙන ආකාරය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- කෘදන්තවල පහත දැක්වෙන හැඳින්වීම සිසුන් ලවා සාමූහික ව කියවන්න.
  **'ධාතුන්ගෙන් පර ව කෘදන්ත ප්‍රත්‍යය එක් කර සාදා ගනු ලබන්නේ කෘදන්ත නම් වේ.'**
- භාෂාවක දක්නට ලැබෙන ව්‍යාකරණාංගයක් ලෙස කෘදන්ත හඳුන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 2 සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි ඇති ඒ ඒ කෘදන්තය සැදෙන අයුරු වියුක්ත කර පෙන්වමින් සාකච්ඡාවක මෙහෙයවන්න.
- ඒ ඒ කෘදන්ත වර්ගය නාමික ව හඳුන්වා දෙන්න.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග) ග්‍රන්ථය සහ පෙළ පොත ඇසුරින් ඒ ඒ කෘදන්තවලට නිදසුන් සොයා ලැයිස්තු ගත කිරීමට සිසුන් මෙහෙයවන්න.
- ලැයිස්තුගත කළ කෘදන්ත යොදා වාක්‍ය ප්‍රකාශ කිරීමටත්, අනතුරුව ඒවා දේවනාගරී අක්ෂරවලින් ලියා දැක්වීමටත් සිසුන් මෙහෙයවන්න.
- ඇමුණුම 2 අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- කෘදන්ත

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කෘදන්තවර්ග හත නම් කිරීම
- කෘදන්තපද සෑසෙන ආකාරය වියුක්ත කර පෙන්වීම
- කෘදන්ත ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- කෘදන්තපද යොදා වාක්‍යනිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 3
- සංස්කෘත භාෂාව, තෙවන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණිය (ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග)

ඇමුණුම 1

කෘදන්ත

- ත්‍රෛකාලිකකෘදන්ත
- අතීතකෘදන්ත
- වර්තමානකෘදන්ත
- අනාගතකෘදන්ත
- අව්‍යයකෘදන්ත
  - තුමන්තක්‍රියා
  - පූර්වක්‍රියා
- භාවකෘදන්ත
- ස්ත්‍රීකෘදන්ත

**ත්‍රෛකාලිකකෘදන්ත** - තනි කෘදන්තපදයකින් කාලත්‍රය ම නිරූපණය වේ නම් ඒ ත්‍රෛකාලිකකෘදන්ත යි. මෙය නාමපදයක් ලෙස භාවිත වේ.

**यच् + अकः > याचकः**

**वधकः । दायकः । खनकः । पावकः । नर्तकः ।**

**याचकः अयाचत् । याचकः याचति । याचकः याचिष्यति ।**

**අතීතකෘදන්ත** - ධාතුවකට අතීතවාචී කෘදන්ත ප්‍රත්‍ය එකතු වී සෑදෙනුයේ අතීතකෘදන්ත යි.

**पच् + आनः > पचानः**

**यजानः । सामगः । सर्वगः । बभजानः । बिभिदानः ।**

**सः ओदनं पचानः अतिष्टत् ।**

**වර්තමානකෘදන්ත** - ධාතුවකට වර්තමාන කෘදන්ත ප්‍රත්‍ය එකතු වී සෑදෙනුයේ වර්තමානකෘදන්ත යි. මෙහි ප්‍රත්‍ය දෙක 'ශතෘ සහ ශාන' වන අතර ඒවා 'අන් සහ මාන' ලෙස ව්‍යවහාර වේ.

**हस् + अन् > हसन्**

**पठन् । पठत् । दीव्यन् । पिबन् । जयन् ।**

**बालकः हसन् धावति ।**

**අනාගතකෘදන්ත** - ධාතුවකට අනාගතකාලවාචී කෘදන්ත ප්‍රත්‍ය එකතු වී සෑදෙනුයේ අනාගතකෘදන්ත යි.

**गम् + स्यत् > गमिष्यत्**

**हरिष्यन् । दास्यन् । नेष्यन् । भविष्यन् । हनिष्यन् ।**

**पिता केदारं गमिष्यन् इतः ततः आलोकयति ।**

**අව්‍යයකෘදන්ත** - ධාතුන් කෙරෙන් ' **तुम्** ' සහ ' **त्वा** ' ප්‍රත්‍යය එකතු වී සෑදෙනුයේ අව්‍යය කෘදන්ත යි. මෙහි අනුප්‍රභේද දෙකක් ලෙස තුමන්ත කෘදන්ත සහ පූර්වක්‍රියා කෘදන්ත සැලකේ.

1. **තුමන්තකෘදන්ත** - ධාතුන් කෙරෙන් ' **तुम्** ' ප්‍රත්‍යය එකතු වී සෑදෙනුයේ තුමන්ත කෘදන්ත යි.

**दा + तुम् > दातुम्**

**जेतुम् । गन्तुम् । हन्तुम् । पठितुम् ।**

**सा पुस्तकं दातुम् इच्छति ।**

2. **පූර්වක්‍රියා කෘදන්ත** - ධාතුන් කෙරෙන් ' **त्वा** ' ප්‍රත්‍යය එකතු වී සෑදෙනුයේ පූර්වක්‍රියා කෘදන්ත යි.

**वस् + त्वा > उषित्वा**

**शयित्वा । गत्वा । उदित्वा । नत्वा । हत्वा ।**

**माता तत्र उषित्वा मां अपश्यत् ,**

**භාවකෘදන්ත** - ධාතුන්ගේ අගට භාවාර්ථයෙහි වූ ධාත්වර්ථ මාත්‍රය වාච්‍ය වන ප්‍රත්‍යය එකතු වී සෑදෙනුයේ භාවකෘදන්ත යි.

**दा + अन > दानम्**

**भूषणम् । हरणम् । हवनम् । वहनम् । देवनम् ।**

**दानं शान्तिकरं सुखम् ।**

**ස්ත්‍රීකෘදන්ත** - ධාතුන් කෙරෙන් යම් යම් ප්‍රත්‍ය යෙදීමෙන් සෑදෙන ස්ත්‍රීලිංගික නාමයෝ ස්ත්‍රී කෘදන්ත යි.

**विद् + आ > विद्या**

**इत्या । शय्या । निषद्या । नम्या । मन्या ।**

**विद्या ददाति विनयम् ।**

මෙහි තුමන්තක්‍රියා යටින් ඉරක් අඳින්න, පූර්වක්‍රියා රවුම් කර දක්වන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| हन्तुम् | पठितुम् | हित्वा | श्रोतुम् | गन्तुम् | आहरति | नयति | पश्यति |
| पतितः | भाषितुम् | यष्टुम् | खनित्वा | पीत्वा | पठति | पातुम् | रचयति |
| नीत्वा | त्यक्तुम् | धरति | कर्तुम् | भक्तुम् | श्रुत्वा | वेष्टुम् | चरित्वा |
| वदन्ति | पातुम् | धावति | नत्वा | शयति | आलोकयति | पठित | कृत्वा |
| पालयित्वा | भक्त्वा | पठित्वा | चरितुम् | खनितुम् | गातुम् | चोरयितुम् | गीत्वा |

1. √नश् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) नश्यति । (2) नश्यते । (3) नष्ट । (4) नष्टुम् ।

2. √नम् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) नत्वा । (2) नमितुम् । (3) नत । (4) नम्यते ।

3. √वद् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) वदितुम् । (2) उदित्वा । (3) उदित । (4) उद्यते ।

4. √वप् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) उप्त्वा । (2) उप्त । (3) वप्तुम् । (4) उप्यते ।

5. √वस् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) वस्यते । (2) उषित । (3) उषित्वा (4) वस्तुम् ।

6. √वच् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) वक्तुम् । (2) उक्त्वा । (3) उच्यते । (4) उक्त ।

7. √यम् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) यम्यते । (2) यत । (3) यत्वा । (4) यमितुम् ।

8 √यज् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) यजति । (2) यष्टुम् । (3) इष्ट । (4) इज्यते ।

9. √शी ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) शयित्वा । (2) शयित । (3) शयितुम् । (4) शयति

10. √विद् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියාව වනුයේ,

(1) विदित्वा । (2) वेदितुम् । (3) विदित । (4) विद्यते ।

11. කෘදන්තවර්ග නම් කර කාලවාචී කෘදන්ත හා ත්‍රෛකාලික කෘදන්තවලට අයත් ප්‍රභේද නම් කරන්න.

12. පහත සඳහන් කෘදන්තවල ධාතුව වෙන් කරන්න.

कर्तृ / दायक / याचक / पचत् / ददत् / भविष्यन् / नेतृ / पिबत् / गोविन्द / श्रावक

13. පහත සඳහන් වර්තමානක්‍රියාපද තුමන්තක්‍රියා බවට හරවන්න.

गायति / वन्दति / पिबति / नमति / लिखति / पतति / जीवति / पूजयति / वसति / गच्छति

14. පහත සඳහන් ක්‍රියාරූප පූර්වක්‍රියා බවට හරවන්න.

श्रुणोति / भवति / ददाति / करोति / हरति / धरति / वारयति / पठति / चरति / रवति

# පාඩම 9 - වාක්‍යනිර්මාණය

**නිපුණතාව** : 8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ගොඩනගයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති ලට්, ලඞ්, ලෝට් ලකාරවලට අදාළ සරල වාක්‍ය ලියයි.
- එක් ලකාරයකට අයත් සරල වාක්‍යයක් දුන් විට අනෙකුත් ලකාරවලට හරවයි.
- වචනත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.
- ඒකවචනයට අයත් සරල වාක්‍යයක් දුන් විට ද්විවචනයට සහ බහුවචනයට හරවයි.
- පුරුෂත්‍රයට අදාළ ව උක්තය, ආඛ්‍යාතය හා කර්මය පමණක් ඇති සරල වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පෙළපොතේ 3 පාඩම වෙත සිසු අවධානය යොමු කරවන්න.
- එහි හැඩතල සම්බන්ධ කර වාක්‍යනිර්මාණය කරවන්න.
- ඇමුණුම 1හි ඇති ප්‍රශ්න කඩදාසි තීරුවල ලියා සිසුන්ට යොමු කරමින් සම්පූර්ණ වාක්‍යවලින් වාචික ව පිළිතුරු ලබා ගැනීමේ තරගයක් පවත්වන්න.
- සංස්කෘත භාෂාවේ වාක්‍යනිර්මාණය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 2 සිසුන්ට සපයා වාක්‍යයක මූලික කොටස් හඳුන්වා දෙමින් එම කොටස් සිරස් ඉරකින් වෙන්කරන ලෙස උපදෙස් දෙන්න.
- උක්තාඛ්‍යාත හා කර්මය සහිත ලට් ලකාර සරල වාක්‍ය 10ක් මාධ්‍ය භාෂාවෙන් ලිවීමට උපදෙස් දෙන්න.
- එම වාක්‍ය සංස්කෘත භාෂාවට නගා දේවනාගරී අකුරෙන් ලියන ලෙස පැවරුමක් දෙන්න.

- ඇමුණුම 3 පරිදි ලට් ලකාර පරස්මෛපද ප්‍රථමපුරුෂ ආඛ්‍යාත සහිත වාක්‍ය 10ක් ලඞ්, ලෘට්, ලෝට් ලකාරවල පරස්මෛපදයේ ප්‍රථමපුරුෂයට හරවා ප්‍රතිනිර්මාණය කරන ලෙස සිසුන් මෙහෙවන්න.
- ඇමුණුම 4 පරිදි ලට් ලකාර පරස්මෛපද මධ්‍යමපුරුෂ වාක්‍ය කිහිපයක් ලඞ්, ලෘට්, ලෝට් ලකාරවල පරස්මෛපදයේ මධ්‍යමපුරුෂයට හරවා ප්‍රතිනිර්මාණයට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 5 පරිදි ලට් ලකාර පරස්මෛපද උත්තමපුරුෂ වාක්‍ය කිහිපයක් ලඞ්, ලෘට්, ලෝට් ලකාරවල පරස්මෛපදයේ උත්තමපුරුෂයට හරවා වාක්‍ය නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 6 පරිදි ලට් ලකාර පරස්මෛපද පුරුෂත්‍රයට අදාළ ඒකවචන ආඛ්‍යාත සහිත වාක්‍ය කිහිපයක් දී එම ලකාරයේ හා පදයේ ද්විවචනයට හා බහුවචනයට හරවා ලිවීමට සිසුන් යොමු කරන්න.
- ලඞ්, ලෘට්, ලෝට් ලකාරපද සම්බන්ධයෙන් ද ඉහත ක්‍රමවේදය අනුගමනය කරන්න.
- පෙළපොතේ 13 පාඩම උපයෝග කර ගනිමින් පූර්වක්‍රියාපද තනාගත් ආකාරයට පූර්වක්‍රියාපද භාවිත කොට වාක්‍ය තවදුරටත් දීර්ඝ කළ හැකි බව පෙන්වා දෙන්න; අභ්‍යාස කරවන්න.
- 3 ශ්‍රේණිය පෙළපොතේ 15 පාඩම උපයෝග කර ගනිමින් තුමන්තපද සාදා ගන්නා අයුරු වටහා දෙමින් එම තුමන්තපද වාක්‍යවල යෙදෙන අයුරු සිසුන් සමග අධ්‍යයනය කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- උක්තය
- ආඛ්‍යාතය
- ලට්, ලඞ්, ලෘට්, ලෝට් ලකාර
- වචනත්‍රය
- පුරුෂත්‍රය
- පූර්වක්‍රියා
- තුමන්තක්‍රියා

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දෙන ලද ලට් ලකාර වාක්‍යයක් නියම කරන ලද ලඞ්, ලෘට්, ලෝට් ලකාරයකට හැරවීම
- ඒකවචන ආඛ්‍යාතයක් සහිත වාක්‍යයක් ද්විවචනයට හා බහුවචනයට නැගීම
- පූර්වක්‍රියා හා තුමන්තක්‍රියා ප්‍රත්‍යය යොදා වාක්‍ය තැනීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - තෙවන ශ්‍රේණිය, පෙළපොත
- ඇමුණුම 1 හි දැක්වෙන ප්‍රශ්නවාක්‍ය ලියූ කඩදාසි තීරු
- ඇමුණුම 2 සිට 6 දක්වා ඇමුණුම්

ඇමුණුම 1

१. कः परिवेणं पालयिष्यति ?
२. अहं किं लेखिष्यामि ?
३. भटसेनाः किं करिष्यन्ति ?
४. त्वं किं वदिष्यसि ?
५. किम् अध्ययनाय महोपकारं भविष्यति ?
६. यूयं किं पठिष्यति ?
७. के कुत्र गमिष्यन्ति ?
८. के कान् वन्दिष्यन्ति ?
९. अमितः च दमितः च कौ भविष्यतः ?
१०. युवां कुत्र निषीदिष्यथः ?
११. के अनागते हसिष्यन्ति ?
१२. आवां किं हरिष्यावः ?

ඇමුණුම 2

१. उपासिका बुद्धं वन्दति ।
२. गोपालौ वृषभान् नयतः ।
३. श्रामणेराः सुभाषितं वदन्ति ।
४. लेखकाः पुस्तकानि रचयन्ति ।
५. भिक्षवः जनान् सुबोधयन्ति ।

ඇමුණුම 3

| | | |
|---|---|---|
| १. यूयं पाठालयं गच्छथ । | २. त्वं पुस्तकं रचयसि । | ३. युवां सत्यं वदथः । |
| ४. त्वं वने वससि । | ५. यूयं धनं दत्थ । | ६. युवां पुस्तकानि पश्यथः । |

ඇමුණුම 4

१. अहं वृक्षात् पतामि ।
२. वयं पाठम् उपदिशामः ।
३. आवां बुद्धं वन्दावः ।
४. वयं पाठालयं गच्छामः ।
५. अहं लोकं जयामि ।
६. आवां गीतगोविन्दं वदावः ।

ඇමුණුම 5

१. वानरः वृक्षात् पतति ।
२. त्वं पाठं पठसि ।
३. यतिः धर्मं वदति ।
४. अहं अक्षरं लिखामि ।
५. अहं बुद्धं नमामि ।
६. त्वं विहारे वससि ।

ඇමුණුම 6

01. පහත සඳහන් වාක්‍ය සිංහලයට නගන්න.

१. बालकः उद्यानं गच्छति । ..........................................................
२. वयं पुस्तकं पठिष्यामः । ..........................................................
३. भूपतयः सर्वदा प्रजां धर्मेण रक्षन्तु । ..........................................................
४. अहं धर्मं देशिष्यामि । ..........................................................
५. पूर्वस्यां दिशि सूर्यः उदयते । ..........................................................
६. श्रामणेरः पर्णशालां गच्छति । ..........................................................
७. वानरः तुङ्गाद् वृक्षात् पतति । ..........................................................
८. सिंहराजाटव्यां मधुराणि फलानि सन्ति । ..........................................................
९. राहुल ! त्वं केन हस्तेन लिखसि । ..........................................................
१०. अहं देशारक्षकः भविष्यामि । ..........................................................

02. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.

1. මව දරුවා නළවයි. ..............................................................................................
2. අපි පර්වතයෙන් වැටුණෙමු. ..............................................................................................
3. ළමයි පොත් පාඩම් කරත්වා! ..............................................................................................
4. මම නිදුක් වෙම්වා! ..............................................................................................
5. මේ අපගේ විහාරය යි. ..............................................................................................
6. සත්පුරුෂයෝ නිවනට යති. ..............................................................................................
7. මම දිනපතා එහි යමි. ..............................................................................................
8. මම කාංචනා වෙමි. ..............................................................................................
9. ඔබ ගිලන්පස සූදානම් කරන්න. ..............................................................................................
10. අපි සිවුරු සෝදමු. ..............................................................................................

# පාඩම 10 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත නාමවරනැගිල්ල

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 සංස්කෘත නාමවරනැගිල්ල පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වය ලබයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත නාමවරනැගිල්ල වනපොත් කරයි.
- අන්තය අනුව වෙනස්කම් හඳුනාගෙන වරනගයි.
- වර නගන ලද විභක්ති අනුව අර්ථ ගැන්වීමේ හැකියාව ලබයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සිසුන් පිරිවෙන් පරිශ්‍රයට කැඳවාගෙන යන්න.
- පිරිවෙන් පරිශ්‍රයේ ඇති ඇසට පෙනෙන විවිධ වස්තූන් හා පුද්ගලයන්ට ප්‍රකාශ කරන නාම සිසුන්ගෙන් විමසන්න.
- ඔවුන් ප්‍රකාශ කරන නාම සංස්කෘත භාෂාවට පරිවර්තනය කර පෙන්වන්න.
- එම නාමපද විවිධ අර්ථවලට වෙන් කළ හැකි බවත්, ඒවා විභක්තිවල වරනගා අර්ථගැන්විය හැකි බවත්, පෙන්වා දෙන්න.
- තෝරා ගත් ශබ්දයක් වරනගා පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**

- සංස්කෘත නාමවරනැගිල්ල සිසුන්ට සපයන්න.
- එහි තෝරා ගත් ශබ්දයක් හඬනගා නිවැරදි උච්චාරණ සහිත ව වරනගා පෙන්වන්න.
- එහි අර්ථය ද පිළිවෙළින් වරනගා පෙන්වන්න.
- තෝරා ගත් ශබ්දය සිසුන් සමග සාමූහික ව හඬනගා කියවන්න.
- එම ශබ්දය වෙන් වෙන් ව සිසුන් ලවා හඬනගා කියවවන්න.
- එම ශබ්දයෙහි අර්ථය විභක්තිවලට අනුව ප්‍රකාශ කර පෙන්වන්න.
- සිසුන් සමග එහි අර්ථය ද ශබ්දනගා කියවන්න.
- සිසුන් කණ්ඩායම් කර එක් කණ්ඩායමකට සංස්කෘත භාෂාවෙන් එය ශබ්ද නගා කීමටත්, අනෙක් කණ්ඩායමට එහි අර්ථය කීමටත් උපදෙස් දෙන්න.

- තෝරා ගත් ශබ්දය ආශ්‍රයෙන් ඊට සමාන ව වරනැගෙන ශබ්ද ඉදිරිපත් කරන්න.
- ඒවා කට පාඩමින් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පෙළපොත ද භාවිත කරමින් ඊට සමාන ශබ්ද වරනැගීමට සිසුන් පුහුණු කරවන්න.
- අන්තය, විභක්තිය, වචනය අනුව ශබ්දවල වරනැගීමේ විශේෂතා පෙන්වා දෙන්න.
- වරනගන ශබ්දයෙහි පද, විභක්තියෙන් විභක්තියට අර්ථ වෙනස් වන ආකාරය පෙන්වා දෙන්න.
- ශබ්ද අර්ථ සමග නිවැරදි ව මතක තබා ගැනීම සංස්කෘත වාක්‍යනිර්මාණයට අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 1 අභ්‍යාසය සිසුන් ලවා කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සංස්කෘත නාම වරනැගිල්ලේ ශබ්ද කට පාඩමින් ප්‍රකාශ කිරීම
- ඒ ඒ ශබ්දවල අර්ථ විභක්ති අනුව ප්‍රකාශ කිරීම
- සමාන ශබ්ද වරනගා පෙන්වීම
- වරනගන ශබ්දවල විභක්තියෙන් විභක්තියට ඇති සමාන අසමානකම් පෙන්වා දීම
- වනපොත් කරන ලද ශබ්ද දේවනාගරී අකුරෙන් ලියා දැක්වීම
- සංස්කෘත වාක්‍යවල යෙදී ඇති නාමපද විභක්ති හා වචන වශයෙන් වෙන් කර දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත නාමවරනැගිල්ල
- සංස්කෘත භාෂාව, තෙවන ශ්‍රේණිය, පෙළපොත

01. පහත ශ්ලෝක කියවා එයින් ගත හැකි ආදර්ශ පාඨ 03 බැගින් ලියන්න.

मुखं पवित्रं यदि बुद्धवाक्यं चित्तेऽपि यस्मिन् करुणागुणस्यात्।
हस्तं पवित्रं प्रददाति दानं पादं पवित्रं गमनं शुभं चेत्॥

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

अर्थेन किं कृपणहस्तगतेन तेन ज्ञानेन किं सकलसत्त्वजनेषु वैरात्।
रूपेण किं गुणपराक्रमवर्जितेन मित्रेण किं व्यसनकालपराङ्मुखेन॥

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

02. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

वर्षासु शाकटिकः कश्चित् स्वशकटे भाण्डान्यारोप्य तं नगरान्तरमनयत्। द्वौ वृषौ तं शकटम् अवहताम्। रथ्यायां पङ्के शकटस्य चक्रं रुद्धमभूत्। वृषभौ बलवत् प्रहरन्नपि स शकटं चलयितुं नाक्षमत। ततः स भगवन्तं नारायणं प्रति चुक्रोश। तस्याक्रोशं श्रुत्वा दयालुर्भगवांस्तस्य पुरस्तादाविरभूत्। अभाषत च शाकटिकम् - 'भो मूढ! किमिति जोषमास्से? मम साहाय्यं वाञ्छसि चेत् उत्तिष्ठ'!

i. කරත්තයට සිදු වූයේ කුමක් ද?

.....................................................................................................................................

ii. කරත්තකරුට පිහිටවීමට පැමිණි දෙවියා කවු ද?

.....................................................................................................................................

iii. **'මඬෙහි'** යන අදහස ඇති සංස්කෘතපදය තෝරා ලියන්න.

.............................................................................................................................................

iv. දෙවියා කරත්තකරුට කීවේ කුමක් ද?

.............................................................................................................................................

v. **अनयत्** යන ක්‍රියාපදය අයත් වන්නේ කුමන කාලයට ද?

.............................................................................................................................................

vi. **मम साहाय्यं वाञ्छसि चेत् उत्तिष्ठ।** යන්නෙහි අර්ථය කුමක් ද?

**व्याघ्रो वन्यः पशुः। सः हिंस्राणां मृगाणां मध्येऽतीव क्रूरः। इतरेभ्यः पशुभ्यो व्याघ्रः शीघ्रतरं धावति। व्याघ्रस्य देहे सर्वत्र कृष्णा बिन्दवो रेखाश्च सन्ति। यदि तस्य स्वभावः शान्तोऽभविष्यत् तर्हि जनास्तं मृगान्तरापेक्षया अधिकतरम् आदरिष्यन्त। चित्रकस्तु व्याघ्रादपि सुन्दरः। चित्रकायः इत्यप्ययं व्यपदिश्यते॥**

i. **व्याघ्रस्य** යන පදයේ විභක්තිය කුමක් ද?

.............................................................................................................................................

ii. අනෙක් සිව්පාවුන් අතර ව්‍යාඝ්‍රයා කෙබඳු ද?

.............................................................................................................................................

iii. **व्याघ्रो वन्यः पशुः।** යන්නෙහි අර්ථය කුමක් ද?

.............................................................................................................................................

iv. ව්‍යාඝ්‍රයාගේ ශරීරය හැමතැන තිබෙන්නේ මොනවා ද?

.............................................................................................................................................

v. **'පුල්ලි'** යන අදහස ඇති සංස්කෘතපදය තෝරා ලියන්න.

.............................................................................................................................................

vi. ව්‍යාඝ්‍රයා හඳුන්වනු ලබන අනෙක් නම කුමක් ද?

.............................................................................................................................................

# පාඩම 11 - නිර්දිෂ්ටග්‍රන්ථ - ව්‍යාසකාරය

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.2 ව්‍යාසකාරය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වය ලබයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක නිවැරදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමින් කියයි.
- ව්‍යාසකරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝකවල අර්ථය ප්‍රකාශ කරයි.
- ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක දේවනාගරී අක්ෂරයෙන් ලියයි.
- විවිධ අවස්ථාවල දී උපදෙස් දීම සඳහා ව්‍යාසකාරය යොදා ගත හැකිබව ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ව්‍යාසකාරයේ තෝරාගත් ශ්ලෝකයක් දේවනාගරී අක්ෂරවලින් ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එය සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- එහි අර්ථය වචනයෙන් වචනය තේරුම් කරන්න.
- යහපත් මනුෂ්‍යයකු ගොඩනැගීම සඳහා ව්‍යාසකාරයේ දායකත්වය අගය කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ව්‍යාසකාරයේ 31 සිට අවසානය දක්වා ශ්ලෝක සංඛ්‍යාව කාලච්ඡේද අනුව සුදුසු පරිදි වෙන් කරගන්න.
- නියමිත දිනයට අදාළ ශ්ලෝක සංයුක්තාක්ෂර මහාප්‍රාණ අක්ෂර උච්චාරණය කරමින් සිසුන්ට හඬ නගා කියවන්නට හුරු කරවන්න.
- එක් එක් සිසුවා තනි තනි ව ශ්ලෝක සජ්ඣායනයට යොමු කරන්න.
- ශ්ලෝකවල අර්ථය පැහැදිලි කර දෙන්න.

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක් දේවනාගරී පෙළ කියනවිට අනෙක් කණ්ඩායමට එහි අර්ථය ප්‍රකාශ කිරීමට උපදෙස් දෙන්න.
- ශ්ලෝක දේවනාගරී අකුරින් ලියවන්න.

**පියවර 2**

- ව්‍යාසකාරය පිළිබඳ පහත දැක්වෙන තොරතුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - එය ව්‍යාස නම් ඍෂිවරයා විසින් ලියන ලද්දක් බව
  - ගරුඩ පුරාණයෙන් උපුටා ගත් ආචාරධර්ම පිළිබඳ ශ්ලෝක එහි අඩංගු බව
  - ඥානය, ස්වාධිපත්‍යය ශිෂ්‍යයා තුළ රෝපණය කිරීම මෙම ශ්ලෝකවලින් සිදුවන බව
  - අසත්පුරුෂධර්ම, කාමය ආදිය පිටුදැකීමට මෙම ශ්ලෝක ඉවහල් වන බව
- ව්‍යාසකාරයේ තෝරා ගත් එක් එක් ශ්ලෝකයක් සම්බන්ධයෙන් ක්ෂණික කථාවක් බැගින් පැවැත්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ව්‍යාසකාරයේ නිර්දිෂ්ටශ්ලෝක කටපාඩමින් ප්‍රකාශ කිරීම
- නිවැරදි ව සංයුක්ත අකුරු හා මහාප්‍රාණ උච්චාරණය කිරීම
- ව්‍යාසකාරයේ ශ්ලෝකවල අර්ථ ප්‍රකාශ කිරීම
- ව්‍යාසකාරයේ ශ්ලෝකවල ඇති වටිනාකම ප්‍රකාශ වන සේ කථාවක් පැවැත්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ව්‍යාසකාරය

# පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - ප්‍රථමාදර්ශය

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.3 ප්‍රථමාදර්ශය පරිශීලනය කරමින් සංස්කෘත භාෂාවේ ප්‍රවීණත්වය ලබයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය කියවයි.
- ප්‍රථමාදර්ශය (1 සිට 15) ගද්‍ය හා පද්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පන්තියෙහි කවර හෝ සිසුවකුට සූර්යයා පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නට උපදෙස් දෙන්න.
- එම සිසුවාගේ අදහස්වලට අනෙක් සිසුන්ගේ අදහස් ද එක්කරන්න.
- සූර්යයා පිළිබඳ මෙන් ම විවිධ මාතෘකා ප්‍රථමාදර්ශයේ ඇති බව ප්‍රකාශ කරන්න.
- ප්‍රථමාදර්ශයේ සූර්යයා පිළිබඳ කියවෙන ගද්‍ය කොටස සිසුන්ට ඉදිරිපත් කර රසවින්දනාත්මක සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පාඩම සංවර්ධනය :**

- ප්‍රථමාදර්ශයේ 1 සිට 15 දක්වා පාඩම් කාලච්ඡේද අනුව වෙන් කරගන්න.
- පහත නිදසුන පරිදි එම පාඩම් සංවර්ධනය කරන්න.
  නිදසුන : ප්‍රථමාදර්ශයේ දෙවන (උද්‍යමඃ කාර්යසාධකඃ) කථාව සිසුන්ට ලබා දෙන්න.
- එම කථාව දේවනාගරී පෙළ බලමින් ශබ්ද නගා නිවැරදි ව කියවන්න.
- නැවත එය සිසුන් සමග සාමූහික ව කියවන්න.
- එක් එක් සිසුවාට ද ශබ්ද නගා කියවන්නට උපදෙස් දෙන්න.
- එම කතාව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර පෙන්වන්න.
- නැවත එය සිසුන්ට ද පරිවර්තනය කර පෙන්වන ලෙස උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන සහ ඒවායේ අර්ථය ලියන්නට උපදෙස් දෙන්න.
- තෝරා ගත් කථාවෙහි සිංහල අර්ථය සංස්කෘත පෙළ බලමින් පන්තිය ඉදිරියේ කියවන්නට අවස්ථාව දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රථමාදර්ශයේ කථා දේවනාගරි පෙළ බලා නිවැරදි ව කියවීම
- දී ඇති සංස්කෘත වචනවල පදගතාර්ථය කීම සහ දේවනාගරී අකුරෙන් ලිවීම
- ප්‍රථමාදර්ශයේ කථා හා ශ්ලෝකවල අර්ථ ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත ප්‍රථමාදර්ශය

# පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - සංස්කෘත පාඨමාලා 3

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.1 සංස්කෘත පාඨමාලා 3 ග්‍රන්ථය ඇසුරින් ප්‍රත්‍යශතකය රස විඳියි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- ප්‍රත්‍යශතකයේ අදාළ ශ්ලෝක මාතෘභාෂාවට පරිවර්තනය කරයි.
- ප්‍රත්‍යශතකය රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 හි ඇතුළත් ප්‍රත්‍යශතකයේ ශ්ලෝකය ශබ්ද මාධුර්යයෙන් යුතු ව කියවා ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- එම ශ්ලෝකය සාමූහික ව සජ්ඣායනා කරන්න.
- එහි අර්ථය සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ප්‍රත්‍යශතකයේ නිර්දේශිත ශ්ලෝක සංඛ්‍යාව සරල බව අනුව පෙළ ගස්වා දිනවලට වෙන් කර ගන්න.
- සංස්කෘත පාඨමාලාව 3 ඇසුරින් දිනයට අදාළ ශ්ලෝක ශිෂ්‍යයන් සමග සාමූහික ව සජ්ඣායනය කරන්න.
- එහි නිවැරදි උච්චාරණය හා යති ස්ථාන පැහැදිලි කර දෙන්න.
- පහත සඳහන් නිදසුන යොදා ගනිමින් ශ්ලෝකයේ පද පෙළගස්වා ගැනීමේ දී (අන්වයේ) ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

**अर्थेन किं कृपणहस्तगतेन तेन।**
**कृपण हस्त गतेन तेन अर्थेन किम्।**

- ශ්ලෝක අර්ථාන්විත ව කියැවීම දැනුම වර්ධනයට හේතුවන බව හා පරිවර්තන ක්‍රියාවලිය පහසු කරවන බව දක්වමින් බහුශ්‍රැත බව අගය කරන්න.

- ඇමුණුම් 1 හි ඇතුළත් ශ්ලෝකය පහත නිදසුනට අනුව සිංහල භාෂාවට පරිවර්තනය කිරීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න

  උදා - කෘපණහස්තගතෙන තෙන අර්ථෙන කිම්?

  (අසත්පුරුෂයකුගේ අතට පත් ධනයෙන් කවර ප්‍රයෝජනයක් ද?)

**පියවර 2**

- සංස්කෘත පාඨමාලාව 3 ඇසුරින් අදාළ ශ්ලෝක වාචෝද්ගත කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම 2 හි ශ්ලෝකය රස වින්දනයට අවස්ථාව ලබා ගන්න. එයින් ජීවිතයට ගත හැකි ආදර්ශය දක්වන්න.
- එහි භාරතීය සමාජය තුළ කාන්තාව දෝෂ දර්ශනයට ලක්වීම පෙන්වන්න.
- සීතා හා සාවිත්‍රී වැනි කාන්තාචරිත හඳුන්වා දී ඒවා පැසසුමට ලක් වී ඇති අයුරු පෙන්වන්න.
- ශ්ලෝකයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ ක්ෂණික කථාවක් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඇමුණුම 3 අභ්‍යාසයට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රත්‍යශතකයේ ශ්ලෝක ශබ්ද නගා කියැවීම
- ප්‍රත්‍යශතකයේ ශ්ලෝක මාතෘභාෂාවට පරිවර්තනය කිරීම
- ඒ ඒ පදයේ අර්ථය ගෙනහැර දක්වමින් ශ්ලෝකවල සමස්ත අර්ථය ප්‍රකාශ කිරීම
- ශ්ලෝකවල උපදෙස් පැහැදිලි කිරීම
- ශ්ලෝකවල සාහිත්‍යාත්මක අගය තුළින් රස වින්දනය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් 1, 2 සහ 3
- සංස්කෘත පාඨමාලාව 3
- ප්‍රත්‍යශතකය

ඇමුණුම 1

अर्थेन किं कृपणहस्तगतेन तेन
ज्ञानेन किं सकलसत्त्वजनेषु वैरात्।
रूपेण किं गुणपराक्रमवर्जितेन
मित्रेण किं व्यसनकालपराङ्मुकेन॥

ඇමුණුම 2

मुखपद्मदलाकारं वाचा चन्दनशीतला।
मधु तिष्ठति जिह्वाग्रे हृदये तु हलाहलम्॥

ඇමුණුම 3

01. (අ) හිතෝපදේශයේ සඳහන් ආගන්තුක මුව, කපුටු, සිවල් කථාව කෙටියෙන් ලියන්න.
(अकस्मादागन्तुना सह मैत्री न युक्ता।)

(ආ) ඉහත කථාව ආශ්‍රයෙන් ගත හැකි ආදර්ශපාඨ 05ක් ලියන්න.

02. (අ) හිතෝපදේශයේ සඳහන් අතිලොභෙ ව්‍යාධ-මෘග-සූකර-සර්ප-ජම්බූක කථාව ලියා දක්වන්න.

(अहो अद्य महद्भोज्यं मे समुपस्तितम्।)

(ආ) ඉහත කථාව ආශ්‍රයෙන් උගත හැකි ආදර්ශපාඨ 05ක් ලියන්න.

# පාඩම 14 - හිතෝපදේශය

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.1 සංස්කෘත පාඨමාලා 3 ග්‍රන්ථය ඇසුරින් හිතෝපදේශය රස විඳියි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :

- හිතෝපදේශයේ අදාළ ගද්‍ය හා පද්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- හිතෝපදේශයේ එන ගද්‍ය හා පද්‍ය කොටස් මාතෘභාෂාවට පරිවර්තනය කරයි.
- හිතෝපදේශය රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පෙරසූදානම :**

හිතෝපද්ශයේ එන **आगन्तुकेन सौहार्दे मृगकाकजम्बूककथा** නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා සිසුන් කිහිප දෙනකු සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- පෙර සූදානම් කරගත් නාට්‍යය රංගනයට අවස්ථාව දෙන්න.
- නාට්‍යය පදනම්කර ගනිමින් හිතෝපදේශය පිළිබඳ හැඳින්වීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- හිතෝපදේශයේ රසමුසු තැන් කිහිපයක් ඉස්මතු කරගනිමින් එය කියවීම සඳහා සිසුන් දිරි ගන්වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සංස්කෘත පාඨමාලා 3 ග්‍රන්ථයේ සඳහන් හිතෝපදේශයේ 2 ශ්ලෝකය යොදා ගනිමින් හිතෝපදේශයේ වටිනාකම පහදන්න.
- හිතෝපදේශය කියවා අර්ථාවබෝධය ලබා ගැනීමේ අගය පිළිබඳ සාකච්ඡාවක් පවත්වන්න.
- එහි දී පහත කරුණු අවධාරණය කරන්න.
  - කියැවීමේ දී නිවැරදි ව අක්ෂර උත්පත්තිය සිදුවිය යුතු බව හා වචන අතර පරතරයක් ඇති ව ශ්‍රාවකයාගේ අවධානය දිනා ගැනීම කළ යුතු බව

- අර්ථය වටහාගනිමින් ප්‍රකාශ කරන්නේ නම් එය අවබෝධයෙන් යුතු ව කියවූ බවට සාක්ෂියක් වන බව

- අවබෝධයෙන් යුතු ව කියැවීම දැනුම හා තොරතුරු ලබා ගැනීමට උපකාරී වන බව

**පියවර 2**

- සංස්කෘත පාඨමාලා 3 හි එන හිතෝපදේශයේ ශ්ලෝක කිහිපයක් ගෙන කියවා අන්වය සකසන්න.
- පළමු ව කියවා අවබෝධ කර ගත යුතු බවත්, මාතෘභාෂාවට නැගිය යුත්තේ ඉන් අනතුරු ව බවත්, පහදා දෙන්න.
- සකසා ගත් අන්වය අනුව අදාළ ශ්ලෝක මාතෘභාෂාවට පරිවර්තනය කරවන්න.
- ගුරු අධීක්ෂණය සහිත ව, හිතෝපදේශයෙන් උපුටා ගත් ගද්‍ය වාක්‍ය කිහිපයක් මාතෘභාෂාවට පරිවර්තනය කරවන්න.
- ඒවායේ උක්ත ආඛ්‍යාතපද සම්බන්ධය පහදන්න.

**පියවර 3**

- සංස්කෘත පාඨමාලා 3 හි **ආගන්තුකේන සෞහාර්දේමෘගකාකජම්බූක කථා** සහ **අපරිචිතාය වසතිදානේන්ද්‍රමෘගෘමාර්ජාරපක්ෂි කථා** සහ **ව්‍යාධ - මෘග - සූකර - සර්ප - ජම්බූක** කථා වෙත සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- එහි රසවින්දනයට ඉඩ සලසමින් කථාවේ සාරය උකහා දක්වන්න.
- ඒ ඇසුරින් උකහා ගත හැකි උපදේශාත්මක බව මතු කර පෙන්වන්න.
- හිතෝපදේශයේ එන කථාවල ආභාසය ලබා ගනිමින් සුදුසු තේමාවක් යටතේ වර්තමාන සමාජයේ ඇති ගැටලුවලට විසඳුම් ගෙනෙන උපදේශාත්මක කථා නිර්මාණයට සිසුන් දිරි ගන්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- හිතෝපදේශයේ දී ඇති පද්‍ය හා ගද්‍ය කියවා අර්ථය පැහැදිලි කිරීම
- එම ගද්‍ය සහ පද්‍ය මාතෘභාෂාවට පරිවර්තනය කිරීම
- අදාළ ගද්‍ය සහ පද්‍ය පන්තිය අභිමුඛයේ ප්‍රකාශ කරමින් රසවිඳීම
- හිතෝපදේශය සමග සමගාමී වන කථා නිර්මාණය කිරීම
- දුරවබෝධපද එකතු කොට වදන් ගොනුවක් සැකසීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත පාඨමාලා 3 ග්‍රන්ථය
- හිතෝපදේශය - පුවතිසි අලගියවන්න
- සංස්කෘත කාව්‍යසාහිත්‍යය - මහාචාර්ය ජයදේව තිලකසිරි

# ඇගයීම හා තක්සේරුකරණය

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබ ගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එ සේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එ ලෙස තම සිසුන් ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන් ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන් ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයා ගේ කාර්යභාරය යි. ඇගයීමේ(තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed Forward) යනුවෙනි. සිසුන් ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්‍ෂාත් වුයේ ද යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්‍ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්‍ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්‍ෂා කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1. | පැවරුම් | 2. | ව්‍යාපෘති |
| 3. | සමීක්‍ෂණ | 4. | ගවේෂණ |
| 5. | නිරීක්‍ෂණ | 6. | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 7. | ක්‍ෂේත්‍ර චාරිකා | 8. | කෙටි ලිඛිත පරීක්‍ෂණ |
| 9. | ව්‍යුහගත රචනා | 10. | විවෘත ග්‍රන්ථ පරීක්‍ෂණ |
| 11. | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. | ශ්‍රවණ පරීක්‍ෂණ |
| 13. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. | කථනය |
| 15. | ස්වනිර්මාණ | 16. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. | සංකල්ප සිතියම | 18. | ද්විත්ව සටහන් ජර්නල |
| 19. | බිත්ති පුවත්පත් | 20. | ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් |
| 21. | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. | විවාද |
| 23. | සාකච්ඡා මණ්ඩල | 24. | සම්මන්ත්‍රණ |
| 25. | ක්‍ෂණික කථා | 26. | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක් මත්, සෑම විෂයක් සම්බන්ධයෙන් මත්, සෑම විෂය ඒකකයකට මත්, යොදා ගත යුතු යැයි අපේක්‍ෂා නොකෙරේ. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය : පළමු වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම : 4.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය : 4.1 ස්වර සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

5. ආධාරකයේ ස්වභාවය : චලන සටහනක් (Mobile Chart) සැකැසීම

6. ආධාරකයේ අරමුණු :
   - ස්වර සන්ධි ප්‍රභේද නම් කිරීමේ හැකියාව ලබා දීම
   - ස්වර සන්ධි ප්‍රභේදවල නිදසුන් වන වචන රැස් කිරීම සහ ඒවා මතකයේ රඳවා ගැනීමට සහාය වීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්
   ගුරු උපදෙස් ඃ

   - සිසුන්ට/සිසු කණ්ඩායම්වලට ස්වර සන්ධි ප්‍රභේද 08 පවරා ඒ ඒ ප්‍රභේදයට අයත් වචන රැස් කිරීමට උපදෙස් දෙන්න.
   - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයට නිශ්චිත කාලයක් ලබා දෙන්න.
   - ඇමුණුමේ දක්වා ඇති ආකාරයට එක ම ප්‍රමාණයට චලන සටහන් සකස් කරවන්න.
   - චාට් සටහන් කැමැති පරිදි වර්ණ ගන්වා චිත්තාකර්ෂණීය ලෙස සැකැසීමට නිදහස දෙන්න.
   - අදාළ චාට් සටහන් 08 පිළිවෙළට අමුණා කොඩි වැලක් සේ පන්තියේ ප්‍රදර්ශනයට සිසුන්ට සහාය වන්න.
   - අදාළ නිර්ණායකවලට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ

- තම කණ්ඩායමට ලැබුණු ස්වර සන්ධි ප්‍රභේදය සහ ඊට අදාළ වචන කාඩ්බෝඩ් කැබැලිවල දෙපැත්තේ ම ලියා චලන සටහන සකසන්න.
- වචන හොඳින් ඉස්මතු වී ඈතට පෙනෙන සේ නිවැරැදි වත්, පැහැදිලි වත්, ලියන්න.
- චලන සටහන්වලින් කොඩි වැලක් ගොඩනගා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

| | නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| 1. | අපේක්ෂිත වචන සංඛ්‍යාව | | | | | | | | | |
| 2. | ඈතට දර්ශනය වීම | | | | | | | | | |
| 3. | පැහැදිලි/නිරවුල් බව | | | | | | | | | |
| 4. | චිත්තාකර්ෂණීය නිමාව | | | | | | | | | |
| 5. | කණ්ඩායම තුළ සහයෝගය | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | |


**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු ය 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට අඩු | නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කර ගත හැකි ය.



# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018
## Primary Piriven Mid Year Term Test - 2018

3 ශ්‍රේණිය /**Grade 3**

**සංස්කෘත භාෂාව** | **කාලය : පැය දෙකයි**

Sanskrit | **විභාග අංකය :**......................................... | Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

♦ **01 සහ 02 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**

**01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දීර්ඝ අකුරු පමණක් අයත් වරණය වන්නේ,

   (1) **अ आ ई ऊ ॠ ।** (2) **आ ई ऊ ॠ ॡ ।** (3) **आ इ ऊ ॠ ॡ ।**

2. සන්ධ්‍යක්ෂර අයත් වන්නේ,

   (1) හ්‍රස්වවලට ය. (2) දීර්ඝවලට ය. (3) අනාමින්වලට ය.

3. ව්‍යඤ්ජනවල **क** සිට **म** දක්වා අකුරු

   (1) වර්ගාක්ෂර යි. (2) ඝෝෂාක්ෂර යි. (3) අඝෝෂාක්ෂර යි.

4. ඌෂ්මන් අක්ෂරවලින් එක් අක්ෂරයක් හෝ යෙදී ඇති වචනය කුමක් ද?

   (1) **अचल ।** (2) **धवल ।** (3) **चषक ।**

5. **वालुकायाम्** යන වචනය අයත් වන්නේ,

   (1) ඒකවචනයට ය. (2) ද්විවචනයට ය. (3) බහුවචනයට ය.

6. **आवाम्** යන උක්තපදයට ගැළපෙන ආඛ්‍යාතපදය තෝරන්න.

   (1) **पठामः ।** (2) **पठथः ।** (3) **पठावः ।**

7. පිළිවෙළින් **ලට්, ලඞ්, ලෘට්** යන ලකාර තුනට අයත් ක්‍රියාපද අයත් වරණය කුමක් ද?

(1) **पठति, अपठत्, पठिष्यति।**

(2) **पठति, पठिष्यति, अपठत्।**

(3) **अपठत्, पठिष्यति, पठति।**

8. **अपतताम्** යන පදය අයත් වන ලකාරය වන්නේ,

(1) ලට් ලකාරයට ය. (2) ලෝට් ලකාරයට ය. (3) ලඞ් ලකාරයට ය.

9. **गायतः** යන වර්තමාන ක්‍රියාවට ගැළපෙන අනාගත ක්‍රියාරූපය තෝරන්න.

(1) **गायताम्।** (2) **गायथः।** (3) **गायिष्यतः।**

10. ..................**जातिकगीतं गायथ।** මෙහි හිස්තැනට ගැළපෙන උක්තපදය කුමක් ද?

(1) **यूयम्।** (2) **त्वम्।** (3) **युवाम्।**

11. **वार्ता** යන පදයට නිවැරදි ව ගැළපෙන විශේෂණපදය තෝරන්න.

(1) **सः।** (2) **सा।** (3) **ताः।**

12. **त्वं ........... हस्तेन लिखसि ?** යන වාක්‍යයේ හිස්තැනට අදාළ පදය තෝරන්න.

(1) **कस्य।** (2) **कया।** (3) **केन।**

13 හිතෝපදේශ කතුවරයාගේ නම කුමක් ද?

(1) නාරායණ ශර්මන් (2) සුදර්ශන (3) සුමංගල නාහිමි

14. **'ගොස්'** යන පූර්වක්‍රියාවේ නිවැරදි සංස්කෘත රූපය වන්නේ,

(1) **गच्छन्।** (2) **गच्छित्वा।** (3) **गत्वा।**

15. හිතෝපදේශය අයත් වන්නේ,

(1) ශතකකාව්‍ය ගණයට ය.

(2) උපදේශකාව්‍ය ගණයට ය.

(3) මහාකාව්‍ය ගණයට ය.

(ලකුණු 2 x 15 = 30 යි)

02. (අ) පහත සඳහන් ගද්‍ය-පද්‍ය පාඨ සිංහලට නගන්න.

इह गोपालः गां पयो दोग्धि। इयं पीवरा गौः। अस्य गोपालस्य तनयः प्रत्यहं प्रभाते दोहनात् परमिमां गां प्रचारभूमिं नयति, सायं च प्रत्यानयति। यद्यपि, गावः पलालं धान्यमन्नं पिण्याकं च भक्षयन्ति तथापि बालतृणे तासां महती प्रीतिः। गोः समीपे तिष्ठति वत्सः। स प्रथमं गोः पयः किञ्चित् पिबति। अनन्तरं गोपो दोहनं करोति। स गोः पार्श्वे भूमावुपविश्य वामहस्तेन पात्रं गृहीत्वा दक्षिणहस्तेन दुग्धं दोग्धि। धेनोः क्षीरं, मधुरं पथ्यं पुष्टिकरं च॥

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 10 යි)

(ආ) कोऽर्थः पुत्रेण जातेन यो न विद्वान्न धार्मिकः।
काणेन चक्षुषा किं वा चक्षुः पीडैव केवलम्॥

.....................................................................................................................................

.....................................................................................................................................

(ලකුණු 04 යි)

मुखं पवित्रं यदि बुद्धवाक्यं चित्तेऽपि यस्मिन् करुणागुणः स्यात्।
हस्तं पवित्रं प्रददाति दानं पादं पवित्रं गमनं शुभं च ॥

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 04 යි)

(ඇ) **दानं विभूषणं लोके** යන ශ්ලෝක අර්ධය සම්පූර්ණ කර දේවනාගරී අකුරු භාවිත කරමින් ලියා දක්වන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 04 යි)

**03.** (අ) √**वस्** ධාතුව (ප්‍රාර්ථනාර්ථ) ලෝට් ලකාර පරස්මෛපදයට අනුව පහත සඳහන් වගුව පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | वसतु | | वसन्तु |
| मध्यमपुरुष | | वसतम् | |
| उत्तमपुरुष | वसानि | | वसाम |

(ලකුණු 1 x 4 = 04 යි)

(ආ) පහත සඳහන් නපුංසකලිංග **तद्** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | तत् | ते | तानि |
| द्वितीया | | ते | |
| तृतीया | तेन | | तैः |
| चतुर्थी | | ताभ्याम् | तेभ्यः |
| पञ्चमी | तस्माात् | ताभ्याम् | |
| षष्ठी | | तयोः | |
| सप्तमी | तस्मिन् | | तेषु |

(ලකුණු 1 x 8 = 08 යි)

**04. (අ)** පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

१. बालकः उद्यानं गच्छति। ..........

२. वयं पुस्तकं पठिष्यामः। ..........

३. भूपतयः सर्वदा प्रजां धर्मेण रक्षन्तु। ..........

(ලකුණු 2 x 3 = 06 යි)

**(ආ)** පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.

i. මව දරුවා නළවයි. ..........

ii. අපි පර්වතයෙන් වැටුණෙමු. ..........

iii. ළමයි පොත් පාඩම් කරත්වා! ..........

(ලකුණු 2 x 3 = 06 යි)

05. පහත සඳහන් ශ්ලෝක සම්පූර්ණ කරන්න.

i. මනො ධාවති සර්වත්‍ර ..............................................................................................

..............................................................................................

ii. දුර්ජනඃ පරිහර්තව්‍යො ..............................................................................................

..............................................................................................

iii. අනභ්‍යාසෙ විෂං විද්‍යා ..............................................................................................

..............................................................................................

iv. නිරුත්සාහං නිරානන්දං ..............................................................................................

..............................................................................................

(ලකුණු 3 x 4 = 12 යි)

06. (අ) වරහන් තුළින් සුදුසු වචන තෝරා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

**( भक्षयामि / हृष्टपुष्टाङ्गः/ चम्पकवती / कुशलं / दृष्ट्वा / मृगकाकौ )**

**अस्ति मगधदेशे ............................ नामारण्याणी । तस्यां चिरान्महता स्नेहे ............................ निवसतः । स च मृगः स्वेच्छया भ्राम्यन् ............................ केनचिच्छृगालेनावलोकितः । तं ............................ शृगालोऽचिन्तयत् - आः कथमेतन्मांसं सुललितं ............................ । भवतु विश्वासं तावदुत्पादयामि । इत्यालोच्योपसृत्याब्रवीत्- मित्र ............................ ते मृगेणोक्तं कस्त्वं स ब्रूते- क्षुद्रबुद्धिनामा जम्बूकोऽहम् ।**

(ලකුණු 1 x 6 = 06 යි)

(ආ) පහත සඳහන් ක්‍රියාපදයන්හි අර්ථ ලියන්න.

i. **नमथ** ..............................................................................................

ii. **पचति** ..............................................................................................

iii. **लिखामि** ..............................................................................................

iv. **अपूजयत्** ..............................................................................................

v. **भविष्यन्ति** ..............................................................................................

vi. **भवन्तु** ..............................................................................................

(ලකුණු 1 x 6 = 06 යි)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**वर्षासु शाकटिकः कश्चित् स्वशकटे भाण्डान्यारोप्य तं नगरान्तरमनयत्। द्वौ वृषौ तं शकटम् अवहताम्। रथ्यायां पङ्के शकटस्य चक्रं रुद्धमभूत्। वृषभौ बलवत् प्रहरन्नपि स शकटं चलयितुं नाक्षमत। ततः स भगवन्तं नारायणं प्रति चुक्रोश। तस्याक्रोशं श्रुत्वा दयालुर्भगवांस्तस्य पुरस्तादाविरभूत्। अभाषत च शाकटिकम् - 'भो मूढ! किमिति जोषमास्से? मम साहाय्यं वाञ्छसि चेत् उत्तिष्ठ'!**

i. කරත්තයට සිදු වූයේ කුමක් ද?

....................................................................................................

ii. කරත්තකරුට පිහිට වීමට පැමිණි දෙවියා කවු ද?

....................................................................................................

iii. **'මඩෙහි'** යන අදහස ඇති සංස්කෘත පදය තෝරා ලියන්න.

....................................................................................................

iv. දෙවියා කරත්තකරුට කීවේ කුමක් ද?

....................................................................................................

v. **अनयत्** යන ක්‍රියාපදය අයත් වන්නේ කුමන කාලයට ද?

....................................................................................................

vi. **मम साहाय्यं वाञ्छसि चेत् उत्तिष्ठ।** යන්නෙහි අර්ථය කුමක් ද?

....................................................................................................

(ලකුණු 2 x 6 = 12 යි)

08. (අ) හිතෝපදේශයේ සඳහන් **ආගන්තුක** මුව, කපුටු, සිවල් කථාව කෙටියෙන් ලියන්න.

**(अकस्मादागन्तुना सह मैत्री न युक्ता ।)**

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 07 යි)

(ආ) ඉහත කථාව ආශ්‍රයෙන් ආදර්ශ පාඨ 05ක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 05 යි)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018
## Primary Piriven Year End Test - 2018

3 ශ්‍රේණිය /**Grade 3**

**සංස්කෘත භාෂාව** — Sanskrit — **විභාග අංකය** :.......................................... — **කාලය : පැය දෙකයි** — Time : Two hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

- **01 සහ 02 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.**

**01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. අඝෝෂාක්ෂර පමණක් අයත් වරණය වන්නේ,

   **१. ग ज ड द ब ।** **२. क च ट त प ।** **३. ङ ञ न ण म ।**

2. සංස්කෘතභාෂාවේ බින්දුව හඳුන්වන්නේ,

   (1) නිග්ගහීතය නමිනි. (2) අනුස්වාරය නමිනි. (3) විසර්ගය නමිනි.

3. වර්ගාන්ත අක්ෂරවලින් එක් අක්ෂරයක් හෝ යෙදී ඇති වචනය කුමක් ද?

   **१. अचल ।** **२. धवल ।** **३. कनक ।**

4. **प्रीणयन्तु** යන්නෙහි ලකාරය කුමක් ද?

   (1) ලෝට් (2) ලට් (3) ලඞ්

5. **अहम्** යන උක්තපදයට ගැළපෙන ආඛ්‍යාතපදය තෝරන්න.

   **१. जयानि ।** **२. जयाव ।** **३. जयाम ।**

6. සංස්කෘතභාෂාවේ ඇති සමාස ප්‍රභේද සංඛ්‍යාව වන්නේ,

   (1) හයකි. (2) හතකි. (3) අටකි.

7. **पठ** යන පදය අයත්වන ලකාරය වන්නේ,

   (1) ලට් ලකාරයට ය. (2) ලෝට් ලකාරයට ය. (3) ලඞ් ලකාරයට ය.

8. ...................... **आकाशे डयते ।** මෙහි හිස්තැනට ගැළපෙන උක්තපදය කුමක් ද?

**१. शकुनः ।** **२. शकुनौ ।** **३. शकुनाः ।**

9. ''**ඓකපද්‍යං, ඓකස්වර්‍යං එකවිභක්තිකත්වං ච**'' යනුවෙන් හඳුන්වන්නේ,

(1) සමාසයේ ප්‍රයෝජන යි.

(2) සන්ධියේ ප්‍රයෝජන යි.

(3) තද්ධිතයේ ප්‍රයෝජන යි.

10. අව්‍යය කෘදන්ත ගණයට අයත් වන්නේ,

(1) සමාස යි. (2) තුමන්ත ක්‍රියා යි. (3) තද්ධිත යි.

11' **दशशीलमातरः** යන පදයට නිවැරදි ව ගැළපෙන විශේෂණපදය තෝරන්න.

**१. सः ।** **२. ताः ।** **३. सा ।**

12. සංස්කෘතභාෂාවේ තද්ධිත ප්‍රභේද සංඛ්‍යාව වන්නේ,

(1) හයකි. (2) හතකි. (3) අටකි.

13. ස්වරසන්ධියේ ඇති ප්‍රභේද ගණන වන්නේ,

(1) හතකි. (2) අටකි. (3) නවයකි.

14. පහත ක්‍රියාපද අතුරින් තුමන්තක්‍රියාපදය තෝරන්න.

**१. ज्ञातुम् ।** **२. ज्ञायते ।** **३. ज्ञात्वा ।**

15. 'ද්‍ය' යන්න සංයුක්තාක්ෂරවලින් ලියූ විට,

**१. घ ।** **२. ध ।** **३. द्य ।**

(ලකුණු 2 x 15 = 30 යි)

02. (අ) පහත සඳහන් ගද්‍ය-පද්‍ය පාඨ සිංහලයට නගන්න.

अयं शृगालः पानीयं पातुं वापीं गतो जले ममज्ज। तेन बहिर्गन्तुं बहवो यत्नाः कृताः। किन्तु ते सर्वे मुधाऽभवन्। अत्रान्तरे कोऽप्यजः पिपासाकुलः परिभ्रमन् तत्रागतः। अपृच्छच्च शृगालम् - 'सखे अपि मधुरं जलम्' इति। शृगालः परेषां वञ्चने नितरां पटुः। अतः स आह - 'मधुरमिति किमुच्यते ! केवलं पीयूषमेव ! प्रभूतं पिबतोऽपि न मे वाञ्छा निवर्तते। न शक्नोम्येतां वापीं हातुम्' - इति॥

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 10 යි)

(ආ) उद्यमेन हि सिध्यन्ति कार्याणि न मनोरथैः।
न हि सुप्तस्य सिंहस्य प्रविशन्ति मुखे मृगाः॥

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 04 යි)

आत्मबुद्धिर्सुखं देति गुरुबुद्धिर्विशेषतः ।
स्त्रीबुद्धिर्विनाशाय बहुबुद्धिर्मरणं भवेत् ॥

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

(ලකුණු 04 යි)

(ඇ) **चन्दनं दधि ताम्बूलं** යන ශ්ලෝක අර්ධය සම්පූර්ණ කර දේවනාගරී අකුරු භාවිත කරමින් ලියා දක්වන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

(ලකුණු 04 යි)

**03.** (අ) √**नम्** ධාතුව ලෝට් ලකාර පරස්මෛපදයට අනුව පහත සඳහන් වගුව පුරවන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | नमतु | | नमन्तु |
| मध्यमपुरुष | | नमतम् | |
| उत्तमपुरुष | नमानि | | नमाम |

(ලකුණු 1 x 4 = 04 යි)

(ආ) පහත සඳහන් **अस्मद्** ශබ්දයේ හිස්තැන් පුරවන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | अहम् | आवाम् | वयम् |
| द्वितीया | | आवाम् | |
| तृतीया | मया | | अस्माभिः |
| चतुर्थी | | | अस्मभ्यः |
| पञ्चमी | मत् | आवाभ्याम् | अस्मत् |
| षष्ठी | | आवयोः | |
| सप्तमी | मयि | आवयोः | |

(ලකුණු 1 x 8 = 08 යි)

04. (අ) පහත සඳහන් වාක්‍ය සිංහලයට නගන්න.

१. अहं धर्मं देशिष्यामि । ........................................................................................

२. पूर्वस्यां दिशि सूर्यः उदयते । ........................................................................................

३. श्रामणेरः पर्णशालां गच्छति । ........................................................................................

(ලකුණු 2 x 3 = 06 යි)

(ආ) පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.

i. මම නිදුක් වෙම්වා! ........................................................................................

ii. මේ අපගේ විහාරයයි. ........................................................................................

iii. සත්පුරුෂයෝ නිවනට යති. ........................................................................................

(ලකුණු 2 x 3 = 06 යි)

05. (අ) පහත සඳහන් ශ්ලෝක සම්පූර්ණ කරන්න.

i. ත්‍යජ දුර්ජන සංසර්ගං ..........................................................................................

..........................................................................................

ii. වරමෙකො ගුණීපුත්‍රො ..........................................................................................

..........................................................................................

iii. ආහාරනිද්‍රාභයමෛථුනං ..........................................................................................

..........................................................................................

(ලකුණු 3 x 3 = 09 යි)

(ආ) පහත ශ්ලෝකය කියවා එයින් ගතහැකි ආදර්ශපාඨ 03ක් ලියන්න.

मुखं पवित्रं यदि बुद्धवाक्यं चित्तेऽपि यस्मिन् करुणागुणस्यात् ।
हस्तं पवित्रं प्रददाति दानं पादं पवित्रं गमनं शुभं चेत् ॥

..........................................................................................

. ..........................................................................................

..........................................................................................

(ලකුණු 03 යි)

06. (අ) වරහන් තුළින් සුදුසු වචන තෝරා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

( प्रभाते / प्रचारभूमिं / बालतृणे / दोग्धि / पीवरा / पलालं / अस्य)

इह गोपालः गां पयो .......................... । इयं .......................... गौः । ..........................
गोपालस्य तनयः प्रत्यहं .......................... दोहनात् परमिमां गां ..........................
नयति सायं च प्रत्यानयति । यद्यपि गावः .......................... तासां महती प्रीतिः ॥

(ලකුණු 1 x 7 = 07 යි)

(ආ) පහත ක්‍රියාපදයන්හි අර්ථ ලියන්න.

i. **पलालं** ...........................................................................

ii. **पठिष्यति** ...........................................................................

iii. **रक्षत** ...........................................................................

iv. **भविष्यन्ति** ...........................................................................

v. **निम्नगा** ...........................................................................

(ලකුණු 1 x 5 = 05 යි)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**व्याघ्रो वन्यः पशुः। सः हिंस्राणां मृगाणां मध्येऽतीव क्रूरः। इतरेभ्यः पशुभ्यो व्याघ्रः शीघ्रतरं धावति। व्याघ्रस्य देहे सर्वत्र कृष्णा बिन्दवो रेखाश्च सन्ति। यदि तस्य स्वभावः शान्तोऽभविष्यत् तर्हि जनास्तं मृगान्तरापेक्षया अधिकतरम् आदरिष्यन्त। चित्रकस्तु व्याघ्रादपि सुन्दरः। चित्रकायः इत्यप्ययं व्यपदिश्यते॥**

i. **व्याघ्रस्य** යන පදයේ විභක්තිය කුමක් ද?

...........................................................................

ii. අනෙක් සිව්පාවුන් අතර ව්‍යාඝ්‍රයා කෙබඳු ද?

...........................................................................

iii. **व्याघ्रो वन्यः पशुः।** යන්නෙහි අර්ථය කුමක් ද?

...........................................................................

iv. ව්‍යාඝ්‍රයාගේ ශරීරය හැමතැන තිබෙන්නේ මොනවා ද?

...........................................................................

v. 'පුල්ලි' යන අදහස ඇති සංස්කෘත පදය තෝරා ලියන්න.

..............................................................................................................................................

vi. ව්‍යාඝ්‍රයා හඳුන්වනු ලබන අනෙක් නම කුමක් ද?

..............................................................................................................................................

(ලකුණු 2 x 6 = 12 යි)

08. (අ) හිතෝපදේශයේ සඳහන් **අතිලොභේ ව්‍යාධ-මෘග-සූකර-සර්ප-ජම්බූක** කථාව ලියා දක්වන්න. **(अहो! अद्य महद्भोज्यं मे समुपस्थितम् ।)**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 07 යි)

(ආ) ඉහත කථාව ආශ්‍රයෙන් ආදර්ශ පාඨ 05ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 05 යි)